# වාර්ෂික වාර්තාව හා ගිණුම්

# 2014

## ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයය

## මිහින්තලේ

රජරට විශ්ව විද්‍යාලීය වාර්ෂික වාර්තාව මගින් අධ්‍යයන ක්‍රියාකාරකම්, වැඩසටහන් සහ කාර්ය සිද්ධීන් පිළිබඳ සංක්ෂිප්ත කරන ලද දළ විස්තරයක් සපයනු ලබයි. මෙහි අඩංගුව ඇති තොරතුරු අදාල අංශ ප්‍රධානීන් විසින් සපයන ලද අතර එකලස් කරනු ලබන්නේ තොරතුරු හා සංඛ්‍යාලේඛණ අංශය විසිනි.



# පටුන


| | | |
|---|---|---|
| **01** | දැක්ම | 05 |
| **02** | මෙහෙවර ප්‍රකාශය | 05 |
| **03** | උපකුලපතිතුමාගේ ප්‍රකාශය | 06 |
| | 3.1 සංවිධාන ව්‍යුහ සටහන | 07 |
| | 3.2 සංක්ෂිප්ත හැඳින්වීම | 08 |
| | 3.3 පාලක මණ්ඩලය සහ සනාතන සභාව | 08-11 |
| | 3.4 විශ්ව විද්‍යාලයේ ප්‍රගතිය | 12-14 |
| **04** | ශිෂ්‍ය සහ පවතින සම්පත් විස්තර | 15 |
| **05** | 2014 වර්ෂයේ උපාධි අපේක්ෂකයන්ගේ තොරතුරු | 16 |
| **06** | විදේශීය සිසුන්ගේ තොරතුරු | 16 |
| **07** | අධ්‍යයන කාර්යය මණ්ඩල තොරතුරු | 17 |
| | 7.1 අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සංක්ෂිප්ත කරන ලද තොරතුරු (වර්ෂ 5ක) | 17 |
| | 7.2 ස්ථිර සේවක මණ්ඩල තොරතුරු | 17 |
| | 7.3 තාවකාලික කොන්ත්‍රාත් සහ ආරාධිත කාර්ය මණ්ඩල | 18 |
| | 7.4 අධ්‍යයන සහයක සහ පුස්තකාල කාර්ය මණ්ඩලය | 18 |
| **08** | අනධ්‍යයන කාර්යය මණ්ඩල විස්තර | 19-20 |
| **09** | පර්යේෂණ නව සොයා ගැනීම් හා ප්‍රකාශන | 21 |
| **10** | වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩ මුළු | 22 |
| **11** | ලැබූ ප්‍රධානයන් | 23 |
| **12** | පවත්වන ලද නව පාඨමාලා තොරතුරු | 23 |
| | **මූල්‍ය ප්‍රගතිය** | |
| **13** | පුනරාවර්තන වියදම් | 24 |
| **14** | ප්‍රාග්ධන වියදම් | 24 |
| | **ව්‍යාපෘති පිළිබඳ තොරතුරු** | |
| **15** | දේශිය සහ විදේශිය අරමුදල් මඟින් සිදුකරන ලද ව්‍යාපෘති | 24 |
| **16** | ව්‍යාපෘති වියදම් | 25 |
| **17** | මූල්‍ය ප්‍රගතිය පිලිබඳ විස්තර (වියදම්) | 25 |
| **18** | මූල්‍ය ප්‍රගතිය පිලිබඳ විස්තර (ඉපැයූ ආදායම්) | 25 |
| **19** | මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය | 26 |
| **20** | ඉදිකිරීම් සඳහාවූ අරමුදල් | 26 |

## ඇමුණුම් A


| | | |
|---|---|---|
| 21 | කෘෂිකර්ම පීඨය | 28-29 |
| 22 | ව්‍යවහාරික විද්‍යා පීඨය | 30-32 |
| 23 | කළමණාකරන අධ්‍යයන පීඨය | 33-34 |
| 24 | වෛද්‍ය සමාන්තර විද්‍යා පීඨය | 35-36 |
| 25 | සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය | 37-38 |


## ඇමුණුම් B


| | | |
|---|---|---|
| 26 | ශාරීරික අධ්‍යාපන අංශයේ කාර්යයන් | 40-42 |
| 27 | ඉංග්‍රීසි භාෂා ඉගෙනුම් ඒකකයේ කාර්යයන් | 43 |
| 28 | වෘත්තීය මාර්ගෝපදේශන ක්‍රියාකාරකම් | 44 |
| 29 | දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානය | 45 |
| 30 | HETC ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් | 46-47 |
| 31 | කාර්යය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ කාර්යයන් | 48 |
| 32 | ප්‍රධාන පරිගණක මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම් | 49 |
| 33 | පුස්තකාල පද්ධතියේ තොරතුරු | 48 |


## ඇමුණුම් C


ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලයේ 2015 වසර සඳහා වූ වාර්ෂික ගිණුම් ප්‍රකාශය 50-61


## ඇමුණුම් D


1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතේ 108(2)වගන්තිය ප්‍රකාර 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලයේ ගිණුම් පිළිබඳ විගණකාධිපති වාර්තාව 62-75


## ඇමුණුම් E


1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතේ 108(2) වගන්ති ප්‍රකාර 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලයේ ගිණුම් පිළිබඳ විගණකාධිපති වාර්තාව සම්බන්ධව විශ්ව විද්‍යාලයේ නිරීක්ෂණ හා ක්‍රියාමාර්ග 76-86




## දැක්ම සහ මෙහෙවර

### 01. දැක්ම



*දැනුම ව්‍යාප්ත කරවීම, පර්යේෂණ කිරීම හා උසස් අධ්‍යාපනයේ අද්විතීය මධ්‍යස්ථානයක් වීම,.*

### 02. මෙහෙවර

*ආචාරධර්ම සපිරි හැසිරීම් රටාවකින් හෙබි අන්‍යෝන්‍ය ගරුත්වයෙන් යුතු සහ ජීවිපැවැත්මක් ප්‍රවර්ධනය කිරීම සඳහා ඉගැන්වීම්, ඉගෙනුම් පර්යේෂණ හා දැනුම ප්‍රචලිත කිරීම උදෙසා හිතකර පරිසරයක් බිහිකිරීමේහිලා කාර්ය මණ්ඩල කැපවීම හා හැකියාවන් වර්ධනය කිරීමෙන් නිර්මාණශිලිත්වයෙන් හෙබි විනයගරුක සහ නව්‍ය අදහස්වලින් හෙබි උසස් ගුණාංගවලින් බුද්ධිමත් පරපුරක් බිහිකරවීම,*



## උපකුලපතිතුමාගේ පණිවිඩය




ශ්‍රී ලංකා රජරට විශ්ව විශ්විද්‍යාලය 2014 වර්ෂයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරන්නේ ඉමහත් ප්‍රීතියෙනි. විශ්ව විද්‍යාලයද ආරම්භකර වසර 18ක කාලයක් ගතවුවද යටිගත පහසුකම් මේ වනවිටත් ප්‍රමාණවත් පරිදි සංවර්ධනය වී නොමැත. එබැවින් ශිෂ්‍ය නේවාසික පහසුකම් වැඩිදියුණු කරලීම සහ දේශන ශාලා හා විද්‍යාගාර පහසුකම් සහිත ඉගැන්වීමේ පරිසරය පුළුල් කිරිම ප්‍රමුඛස්ථානයක් දියයුතු ක්ෂේත්‍රයන් ලෙස මෙම කාලපරිච්ඡේදය තුළදී හඳුනා ගෙන ඇත. HETC ව්‍යාපෘතිය මඟින් අරමුදල් යොදවමින් අධ්‍යයන වැඩ සටහන් වල වැඩිදියුණු කිරිම් සිදුකර ඇත. අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල සංවර්ධනය උදෙසා අවශ්‍ය අවධානය යොමු කර ඇති අතරම විදේශ පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ හා සමුළු සඳහා සහභාගි විම් උදෙසා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ ක්‍රියාකාරි සහභාගීත්වය වැඩිකරලීම පිණිස අවශ්‍ය පුහුණු කටයුතු සලසා ඇත.

සහතික පත්‍ර පඨමාලාවන්හි පශ්චාත් උපාධි පාඨමාලා දක්වා පුළුල් පරාසයක විහිදී යන අකාරයට ප්‍රජා අවශ්‍යතාවයන් ඉලක්ක කරගත් ස්වමුල්‍ය පාඨමාලා ආරම්භ කිරිම තුළින් ආදායම් ජනනය කිරිමට කටයුතු කර ඇත. සියළුම පීඨතුල ප්‍රජා සත්කාරක වැඩ සටහන් සැලකිය යුතු ස්ථානයක් හිමි කරගෙන ඇත. (වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය, කෘෂි කර්ම පියය, ව්‍යවහාරික පීඨය, කළමණාකරන අධ්‍යන පියය හා සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍රීය පියයන් හි අදාල ක්ෂේත්‍ර) ශිෂ්‍ය බඳවා ගැනිම් හා උපාධිධාරි මෙම නිමැවුමේ ධනාත්මක නැඹුරුවක් පවතින අතර 2014 වර්ෂයේදී එය පිළිවෙලින් 1127 සහ 840ක් වේ.ස්වකීය අධ්‍යයන පරික්ෂණ කටයුතු කෙරෙහි කාර්ය මණ්ඩලය යොමුවීම උදෙසා ප්‍රමුළු අධ්‍යයනයක් ලබා ඇති අතර 2014 වර්ෂයේ ඒ සඳහා උපයෝජිත මුළු මුදල රුපියල් මිලියන 14වේ. එනම් 2013 වර්ෂයට සාපෙක්ෂව දෙගුණයක ඉහල යාමකි. මෙම සියළුම කරුණු අනුව වාර්තාගත වර්ෂයේ විශ්ව විද්‍යාලයේ කාර්ය සාධනය වඩාත් හොඳින් සිදු කර ඇත.

මහාචාර්ය රංජිත් විජයවර්ධන

උපකුලපති

# ORGANIZATIONAL STRUCTURE



## 3.2 රජරට විශ්වවිද්‍යාලයේ හැඳින්වීම

අනුරාධපුරයට කිලෝ මීටර් 15 ක් නැගෙනහිරින් පිහිටි, ඓතිහාසික පුදබිමක් වන මිහින්තලා නගරයට නුදුරින් රජරට විශ්ව විද්‍යාලය 1995 නොවැම්බර් 07 වන දින පිහිටුවන ලදි. මෙහි ආරම්භයත් සමග අදෘශ්‍යමානවු සමාජීය සංවර්ධනයට පිටුවහලක් මෙන්ම, වර්තමානයේ තවත් එක් අධ්‍යයන මධ්‍යස්ථානයක් ලෙස ශ්‍රී ලංකා ඉතිහාසයට එක් විය. මෙමගින් 21 වන සියවසේ අවශ්‍යතාවක් වන ධාර්මිෂ්ඨ, බුද්ධිමත් මෙන්ම කාර්යක්ෂම වු නගරයක් නිර්මාණයකිරීම සිදු විය.



### 3.3 පාලක මණ්ඩලය, සනාතන සභාව සහ පරිපාලන කාර්ය මණ්ඩලය

<u>**පාලක මණ්ඩලය**</u>

| | |
|---|---|
| මහාචාර්ය කේ. එච්. ආර් විජේවර්ධන | සභාපති |

**පීඨාධිපතිවරුන්**

| | |
|---|---|
| ආචාර්ය එම්. ජී. ටී. එස් අමරසේකර | කෘෂිකර්ම පීඨය |
| ආචාර්ය බී. ඒ කරුණාරත්න | ව්‍යවහාරික විද්‍යා පීඨය |
| පී. ඩී. එන්. කේ පලිහේන මහතා | කළමනාකරණ අධ්‍යයන පීඨය |
| මහාචාර්ය එස්. එච් සිරිබද්ධන | වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය |
| ටී විරසේකර මහතා | සමාජවිද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය |

**නම් කරන ලද සමාජිකයන්**

අතිපූජ්‍ය එන් ප්‍රඥානන්ද ස්වාමීන් වහන්සේ

එම් සෙනෙවිරත්න මහතා

එච්. එම්. ආර් බී හේරත් මහතා

ආචාර්ය අතපත්තු මහතා

ආචාර්ය එම් රළපනාව

ඩබ්ලිව්. එම් සමරසිංහ මහතා

සී හටන්ගල මහත්මිය

එච්. එම් අබේකෝන් මහතා

ආර් වික්‍රමසිංහ මහතා

**සනාතන සභා සමාජිකයින්**

| | |
|---|---|
| ආචාර්ය එන්. ජේ දහනායක | වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය |
| ආචාර්ය කේ. පී. ඒ උදයකුමාර | කළමනාකරණ අධ්‍යයන පීඨය |

**<u>සනාතන සභාව</u>**

| | |
|---|---|
| මහාචාර්ය කේ. එච්. රංජිත් විජේවර්ධන | උප කුලපතිතුමා |

**පීඨාධිපතිවරු**

| | |
|---|---|
| ආචාර්ය එම්. පී. ටී. එස් අමරසේකර | කෘෂිකර්ම පීඨය |
| ආචාර්ය බී. ඒ කරුණාරත්න | ව්‍යවහාරික විද්‍යා පීඨය |
| පී. ඩී. එන්. කේ පලිහේන මහතා | කළමනාකරණ අධ්‍යයන පීඨය |
| මහාචාර්ය එස්. එච් සිරිබද්ධන | වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය |
| ටී විරසේකර මහතා | සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය |
| ඒ. එස් සිරිවර්ධන මහත්මිය | පුස්තකාලාධිපති |

**අංශ ප්‍රධානීන්**

| | |
|---|---|
| ආචාර්ය ජී. ඒ. එස් ගිනිගද්දර | කෘෂිකර්ම පද්ධතිය |
| ආචාර්ය ඒ බාලසූරිය | ශාක විද්‍යා අංශය |
| එච්. එම්. ඒ. එම්. සි හේරත් මහතා | පාංශු හා ජල සම්පත් කළමනාකරණය අංශය |
| ආචාර්ය ටී. සි බමුණුආරච්චිගේ | ජීව විද්‍යාව අංශය |
| වෛද්‍ය කේ. පී. ඒ උදයකුමාර | ගිණුම්කරණ හා මූල්‍ය අංශය |
| ජේ. කේ මල්ලිකා මහත්මිය | ව්‍යාපාර කළමනාකරණය අංශය |
| එස්. එන්. එස් දහනායක මහත්මිය | සංචාරක හා ආගන්තුක සත්කාර කළමනාකරණය අංශය |
| මහාචාර්ය ජේ. එස් එදිරිසිංහ | කායච්ඡේදන අධ්‍යයන අංශය / පරපෝෂි විද්‍යා අංශය |
| ආචාර්ය එස්. පී වික්‍රමගේ | ක්ෂුද්‍ර ජීව විද්‍යා අධ්‍යයන අංශය |
| මහාචාර්ය ඩී. ජේ වෙයිල්ගම | ක්ෂුද්‍ර ජීව විද්‍යා අධ්‍යයන අංශය |
| ආචාර්ය එන්. ජේ දහනායක | වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය |
| ආචාර්ය ෆසිල් මරික්කාර් | ජෛවරසායන අධ්‍යයන අංශය |
| ආචාර්ය එස්. පී. බී තලගස්පිටිය | ශල්‍ය වෛද්‍යඅධ්‍යයන අංශය |
| ආචාර්ය එස්. බී අගම්පොඩි | ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යයන |
| ආචාර්ය එන්. හෙට්ටිගම | ප්‍රසව හා නාරිවේද අධ්‍යයන අංශය |
| ආචාර්ය ඒ. බී සෙනෙවිරත්න | අධිකරණ වෛද්‍ය අධ්‍යයන අංශය |
| කේ. එස් දෙණිපිටිය මහත්මිය | සමාජ විද්‍යා අංශය |
| ආචාර්ය ඩී. එම්. ඩබ්ලිව්. කේ දිසානායක | මානව ශාස්ත්‍ර අංශය |

| | |
|---|---|
| සි. ආර් විතානආච්චි මහතා | පුරාවිද්‍යා හා උරුමයන් කළමනාකරණය අංශය |

**මහාචාර්යවරුන්**


| | |
|---|---|
| මහාචාර්ය වයි. එම් වික්‍රමසිංහ | කෘෂිකර්ම පීඨය |
| මහාචාර්ය පී. ඒ වීරසිංහ | කෘෂිකර්ම පීඨය |
| මහාචාර්ය සනත් හෙට්ටිආරච්චි | ව්‍යවහාරික විද්‍යා පීඨය |
| මහාචාර්ය පී. ඒ. ජේ පෙරේරා | වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය |

**පීඨ මඟින් නම්කරන ලද සමාජිකයන්**

| | |
|---|---|
| ආචාර්ය ඩී. ඒ. යූ. ඩී දේවසිංහ | කෘෂිකර්ම පීඨය |
| ආචාර්ය ආර්. ඩී. සී. එස් රණදීර | කෘෂිකර්ම පීඨය |
| ආචාර්ය ඩබ්ලිව්. එම් ශ්‍රීයානි | ව්‍යවහාරික විද්‍යා පීඨය |
| ආචාර්ය යු දහනායක | ව්‍යවහාරික විද්‍යා පීඨය |
| ආචාර්ය ඩබ්ලිව්. පී විජේවර්ධන | කළමණාකරන අධ්‍යයන පීඨය |
| ආර්. කේ. ඩී රන්දෙණි මහතා | කළමණාකරන අධ්‍යයන පීඨය |
| ආචාර්ය ආර්. එම්. යූ රත්නායක මෙනවිය | වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය |
| ආචාර්ය එස්. ඩී පිලපීය | වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය |
| ආචාර්ය ජේ. එම්. එස්. බී ජයසුමන | සමාජවිද්‍යා සහ මානව ශාස්ත්‍ර විද්‍යා පීඨය |
| ආචාර්ය සේන නානායක්කාර | සමාජවිද්‍යා සහ මානව ශාස්ත්‍ර විද්‍යා පීඨය |

**ආරාධිත සමාජිකයන්**

| | |
|---|---|
| පී. පී මුණසිංහ මහතා | අධ්‍යක්ෂක, පරිගණක මධ්‍යස්ථානය |
| ආර්. එම් ධනපාල මහතා | අංශ ප්‍රධාන, ඉංග්‍රිසි භාෂා ඉගැන්වීම් ඒකකය |



# පරිපාලන කාර්ය මණ්ඩලය

| | |
|---|---|
| ආර්. එම්. පී. බී අබේසිංහ මහතා | ලේඛකාධිකාරි |
| ෆසිල් යූ.ආර් රහමන් මහතා | මුල්‍යාධිකාරි |
| එස්. එම් සීලරත්න මහතා | වැඩ ඉංජිනේරු |
| සුදත් සේනක මහතා | නියෝජ්‍ය ලේඛකාධිකාරි |
| එස්. එච් උවයිසුල්කර්නි මහතා | නියෝජ්‍ය ලේඛකාධිකාරි |
| ඩී. සී. සී. පී විමලසේන මහතා | අධ්‍යක්ෂක ශාරීරික අධ්‍යයන අංශය |
| | |
| එස්. එස්. කේ ගොඩකුඹුර මහතා | ජ්‍යෙෂ්ඨ සහකාර මුල්‍යාධිකාරි |
| ඩබ්ලිව්. එම්. ආර්. ඩබ්ලිව්. ඒ. බී වැලිවිට මහතා | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි |
| එස්. ඒ. අයි සෝමරත්න මහතා | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි |
| සී හෙට්ටිගේ මහතා | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි |
| නන්තකුමාර් මහතා | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි |
| | |
| එම්. ඩබ්ලිව්. ආර්. එස් රූපසිංහ මෙනවිය | සහකාර අභ්‍යන්තර විගණක |
| එම්. එම්. එස් සංජීව මහතා | සහකාර ලේඛකාධිකාරි |
| ඩබ්ලිව්. බී දිසානායක මහතා | සහකාර ලේඛකාධිකාරි |
| එච්. පී ගුනවර්ධන මහත්මිය | සහකාර ලේඛකාධිකාරි |
| ඩබ්ලිව්. එම්. කේ උපුල්දෙණිය මහතා | සහකාර ලේඛකාධිකාරි |
| එච්. එස්. එම්. ඩී. එස්. එම් සමරකෝන් මෙනවිය | සහකාර ලේඛකාධිකාරි |
| පී. ජේ සෙනෙවිරත්න මෙනවිය | සහකාර ලේඛකාධිකාරි |
| එස්. ඩී. එස්. කේ සමරතුංග මෙනවිය | සහකාර ලේඛකාධිකාරි |
| එම් අරුන්ශංකර් මහතා | සහකාර ලේඛකාධිකාරි |
| ඩී. එම්. ආර් සමන්ත මහතා | සහකාර මුල්‍යාධිකාරි |
| ජේ. එම්. එස්. කේ ජයලත් මහතා | සහකාර මුල්‍යාධිකාරි |
| | |
| ඩී. එම්. සී. යූ. කේ දිසානායක මහතා | සහකාර ලේඛකාධිකාරි (පුස්තකාල සේවා) |
| එම්. ඒ එන්. එන් කුමාරි මහත්මිය | උපකුලපති තුමාගේ පෞද්ගලික ලේකම් |
| බී. ඩබ්ලිව්. එන්. ජේ සමරවීර මහතා | ගොවිපල කළමණාකරු |

## 3.4 විශ්ව විද්‍යාල ප්‍රගතිය


### රජරට විශ්ව විද්‍යාල වෙබ් ශ්‍රේණිගත කිරිම

1996 ස්ථාපිත කරන ලද රජරට විශ්ව විද්‍යාලය 2014 වන විට වසර 18 පසුකර ඇත. වර්තමානයේ දැකිය හැකි තත්වය පිළිබඳ විශ්ව විද්‍යාලයන්හි වෙබ් ශ්‍රේණිගත කිරිම සාක්ෂි දරයි. මේ අනුව වසර 03ක ශ්‍රේණිගත කිරිම් පහත වගුවෙන් පෙන්වා දි තිබේ. 2014 වන විට මට්ටම් 02කින් ඉහලට ගමන් කිරිමක් ද ලෝක ශ්‍රේණිගත කිරිම අනුව 3456 මට්ටමට ලඟා විමද පෙන්වයි.

| වර්ෂය | 2012 | 2013 | 2014 |
|---|---|---|---|
| World Rank | 6228 | 13494 | 10153 |
| Presence Rank | 11794 | 14942 | 7273 |
| Impact Rank | 7277 | 12952 | 12059 |
| Openness Rank | 3613 | 10219 | 8142 |
| Excellence Rank | 4603 | 4583 | 5155 |
| Sri Lankan Rank | 9 | 15 | 11 |

* Definitions of Terms are as given in the Web: http//studentlanka.com

A Graphic Presentation of the University Web Rankings



විශ්ව විද්‍යාලයේ ඇති පීඨ සහ අධ්‍යයන දෙපාර්තමේන්තු

| පීඨය | පීඨාධිපති | දෙපාර්තමේන්තුව | අංශ ප්‍රධාන |
|---|---|---|---|
| කෘෂිකර්ම පීඨය | වෛද්‍ය එම්. පී. ටී. එස් අමරසේකර | කෘෂිකර්ම පද්ධති අංශය | ආචාර්ය ජී. ඒ. එස් ගිනිගද්දර |
| | | පාංශු හා ජල සම්පත් කළමනාකරණය අංශය | එම්. එච්. ජේ. පි ගුනරත්න මහතා |
| | | ශාක විද්‍යාව අංශය | ආචාර්ය ඒ බාලසූරිය |
| ව්‍යවහාරික හා සමාන්තර විද්‍යා පීඨය | වෛද්‍ය බි. ඒ කරුණාරත්න | භෞතික විද්‍යාව අංශය | ආචාර්ය එච්. ඒ. එම්. සි හේරත් |
| | | ජීව විද්‍යාව අංශය | ආචාර්ය ටි. සි බමුණුආරච්චි |
| | | සෞඛ්‍යය ප්‍රවර්ධන වැඩසටහන | |
| කළමණාකරන පීඨය | පි. ඩි. එන්. කේ පලිහේන මහතා | ගිණුම්කරණ හා මූල්‍ය අංශය | ආචාර්ය කේ. පී. ඒ උදයකුමාර |
| | | ව්‍යාපාර කළමනාකරණය අංශය | ජේ. එස් මල්ලිකා මහත්මිය |
| | | සංචාරක හා ආගන්තුක සත්කාර කළමනාකරණය අංශය | එස්. එන්. එස් දහනායක මහත්මිය |
| වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය | මහාචාර්ය එස්. එච් සිරිබද්ධන | කායච්ඡේදන අධ්‍යයන අංශය | |
| | | කායික විද්‍යා අධ්‍යයන අංශය | මහාචාර්ය එම් උඩුපිහිල්ල |
| | | ජෛවරසායන අධ්‍යයන අංශය | ආචාර්ය ෆසිල් මරික්කාර් |
| | | ඖෂධ විද්‍යා අධ්‍යයන අංශය | |
| | | රෝග නිශ්චය පිළිබඳ අධ්‍යයන අංශය | |
| | | පරපෝෂ විද්‍යා අධයන අංශය | |
| | | ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය | ආචාර්ය එස්. බි අගම්පොඩි |
| | | පවුල් වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය | |
| | | ක්ෂුද්‍ර ජීව විද්‍යා අධ්‍යයන අංශය | මහාචාර්ය ඩි. ජේ වෙයිල්ගම |
| | | අධිකරණ වෛද්‍ය අධ්‍යයන අංශය | ආචාර්ය ඒ. බි සෙනෙවිරත්න |
| | | වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය | ආචාර්ය එන්. ජේ දහනායක |
| | | ශල්‍ය වෛද්‍ය අධ්‍යයන අංශය | ආචාර්ය එස්. පි. බි තල්ගස්පිටිය |
| | | ප්‍රසව හා නාරිවේද අධ්‍යයන අංශය | ආචාර්ය එන් හෙට්ටිගම |
| | | මනෝ වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය | |
| | | ළමා රෝග විද්‍යා අංශය | |
| | | වෛද්‍ය අධ්‍යාපන අංශය | |
| සමාජ විද්‍යාව සහ මානව ශාස්ත්‍රපීඨය | ටි විරසේකර මහතා | සමාජ විද්‍යාව | කේ. එස් දෙනිපිටිය මහත්මිය |
| | | මානව ශාස්ත්‍ර | ආචාර්ය ඩි. එම්. ඩබ්ලිව්. කේ දිසානායක |
| | | පුරාවිද්‍යා හා උරුමයන් කළමනාකරණය | සි. ආර් විතානච්චි මහතා |




### පීඨයන්හි ප්‍රගති සමාලෝචනය 2014

| පීඨය | අංශය | අධ්‍යයන කාර්ය මණ්ඩලය | සම්මාන | පර්යේෂණ | නවෝත්පාදන | සඟරා, පොත් සහ ලිපි | | |
|---|---|---|---|---|---|---|---|---|
| කෘෂිකර්ම පීඨය | 3 | 40 | 3 | 107 | 2 | 31 | 03 | 14 |
| ව්‍යවහාරික හා සමාන්තර විද්‍යා පීඨය | 3 | 36 | 1 | 46 | 3 | 37 | 0 | 64 |
| කළමණාකරන පීඨය | 3 | 33 | 0 | 13 | 0 | 0 | 0 | 39 |
| වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය | 15 | 39 | 5 | 10 | 0 | 43 | 0 | 6 |
| සමාජ විද්‍යාව සහ මානව ශාස්ත්‍රපීඨය | 3 | 34 | 0 | 2 | 4 | 24 | 8 | 21 |
| එකතුව | 27 | 182 | 9 | 178 | 9 | 135 | 11 | 144 |


### වර්ෂ 15කදී විශ්ව විද්‍යාලයේ සාරාංශගත කරන ලද තොරතුරු


| වර්ෂ | පිටවුම් | ඇතුලත් වීම් | කාර්ය මණ්ඩල | |
|---|---|---|---|---|
| | | | අධ්‍යයන | අනධ්‍යයන |
| 2000 | 144 | 359 | 55 | 158 |
| 2005 | 435 | 582 | 82 | 208 |
| 2010 | 640 | 1071 | 136 | 348 |



## 04. ශිෂ්‍ය සහ පවතින සම්පත් විස්තර

| පීඨය | සිසුන් | අධ්‍යයන මණ්ඩලය | අනධ්‍යයන මණ්ඩලය |
|---|---|---|---|
| කෘෂිකර්ම පීඨය | 317 | 40 | 30 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 678 | 36 | 31 |
| කළමනාකරණ අධ්‍යයන පීඨය | 1338 | 33 | 14 |
| වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය | 902 | 39 | 71 |
| සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය | 1281 | 34 | 15 |
| එකතුව | **4516** | **182** | **146** |



## 05. 2014 වර්ෂයේ උපාධි අපේක්ෂකයන්ගේ තොරතුරු

| පීඨය | පාඨමාලාව | මාධ්‍යය | පළමු වසර සිසුන් | | දෙවන වසර සිසුන් | | තෙවන වසර සිසුන් | | සිව්වන වසර සිසුන් | | පස්වන වසර සිසුන් | | මුළු සිසුන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | පි | ගැ | පි | ගැ | පි | ගැ | පි | ගැ | පි | ගැ | |
| කෘෂිකර්ම පීඨය | විද්‍යාවේදී | ඉංග්‍රීසි | 29 | 65 | 19 | 56 | 25 | 41 | 35 | 47 | | | 317 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | විද්‍යාවේදී | ඉංග්‍රීසි | 37 | 51 | 50 | 68 | 57 | 56 | 16 | 4 | | | 339 |
| | විද්‍යාවේදී | ඉංග්‍රීසි | 12 | 53 | 32 | 61 | 22 | 41 | 4 | 10 | | | 235 |
| | විද්‍යාවේදී | ඉංග්‍රීසි | 10 | 22 | 8 | 33 | 9 | 19 | 2 | 1 | | | 104 |
| කළමනාකරණ පීඨය | විද්‍යාවේදී | ඉංග්‍රීසි | 152 | 162 | 186 | 223 | 183 | 174 | 124 | 134 | | | 1338 |
| වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය | වෛද්‍ය | ඉංග්‍රීසි | 72 | 107 | 65 | 114 | 59 | 121 | 69 | 111 | 88 | 96 | 902 |
| සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය | ශාස්ත්‍රවේදී | ඉංග්‍රිසි හා සිංහල | 52 | 303 | 91 | 421 | 64 | 236 | 28 | 86 | | | 1281 |
| එකතුව | | | **364** | **763** | **451** | **976** | **419** | **688** | **278** | **393** | **88** | **96** | **4516** |

සාරාංශගත කරන ලද වර්ෂ 5ක් තුල ශිෂ්‍ය විස්තර

| වර්ෂ | ශිෂ්‍යයින් |
|---|---|
| 2010 | 4309 |
| 2011 | 4385 |
| 2012 | 4751 |
| 2013 | 4463 |
| 2014 | 4516 |


## 06. විදේශිය සිසුන්ගේ තොරතුරු

| පීඨය | පාඨමාලාව | මාධ්‍යය | ඇතුළත් කරගැනීම | පළමු වසර සිසුන් | දෙවන වසර සිසුන් | තෙවන වසර සිසුන් | සිව්වන වසර සිසුන් | මුළු සිසුන් |
|---|---|---|---|---|---|---|---|---|
| කෘෂිකර්ම පීඨය | | | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | ව්‍යවහාරික විද්‍යාව | En | 0 | 0 | 2 | 0 | 0 | 0 |
| කළමනාකරණ පිඨය | සංචාරක හා ආගන්තුක සත්කාර කළමනාකරණය | En | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය | වෛද්‍ය හා ශෛල්‍යකර්ම | Eng | 3 | 3 | 2 | 3 | 0 | 0 |
| සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය | | | 0 | 0 | 0 | 0 | 0 | 0 |

# 07. අධ්‍යයන කාර්යය මණ්ඩල විස්තර (ස්ථිර)

| පීඨය | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|
| කෘෂිකර්ම පීඨය | 28 | 29 | 32 | 39 | 40 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 24 | 27 | 32 | 33 | 36 |
| කළමනාකරණ අධ්‍යයන පීඨය | 27 | 31 | 30 | 35 | 33 |
| වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය | 30 | 34 | 44 | 39 | 39 |
| සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය | 27 | 43 | 29 | 35 | 40 |
| එකතුව | 136 | 164 | 167 | 181 | 188 |

**7.1 සාරාංශගත කරන ලද වර්ෂ 5ක් තුල අධ්‍යයන සේවක විස්තර**




7.2 අධ්‍යයන සේවක විස්තර (ස්ථිර)

| පීඨය | මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය | පරිවාස කථිකාචාර්ය |
|---|---|---|---|---|
| කෘෂිකර්ම පීඨය | 2 | 18 | 20 | - |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 1 | 19 | 16 | - |
| කළමනාකරණ අධ්‍යයන පීඨය | 1 | 16 | 16 | - |
| වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය | 1 | 6 | 32 | - |
| සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය | 1 | 11 | 22 | 6 |
| එකතුව | **6** | **70** | **106** | **6** |

### 7.3 අධ්‍යයන සේවක විස්තර (පරිවාස, කොන්ත්‍රාත් ආදි දේශකයන්)

| අංශය | | මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය | උපදේශක | පරිවාස | නිබන්ධක | බාහිර |
|---|---|---|---|---|---|---|---|---|
| කෘෂිකර්ම පීඨය | තාවකාලික | | 1 | 4 | | 32 | 2 | |
| | අනියම් | | | | | | | |
| | පැවරුම් පදනම | | | | 1 | | | |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | තාවකාලික | | | 5 | | 23 | 1 | 70 |
| | අනියම් | | | | | | | |
| | පැවරුම් පදනම | | | | | | | |
| කළමනාකරණ අධ්‍යයන පීඨය | තාවකාලික | | | | | | | 65 |
| | අනියම් | | | | | | | |
| | පැවරුම් පදනම | | | | | | | |
| වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය | තාවකාලික | | | 5 | | 77 | | 45 |
| | අනියම් | 2 | | | | | | |
| | පැවරුම් පදනම | 3 | | | | | | |
| සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය | තාවකාලික | | 1 | | | | | 18 |
| | අනියම් | | | | | | | |
| | පැවරුම් පදනම | 1 | | | | | | |
| එකතුව | | **6** | **2** | **14** | **1** | **132** | **3** | **198** |

### 7.4 අධ්‍යයන සහයක කාර්යය මණ්ඩල විස්තර


| අංශය | ස්ථිර |
|---|---|
| පුස්තකාලයාධිපති | 1 |
| ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති | 4 |
| සහකාර පුස්තකාලයාධිපති | 1 |
| වෘත්තීය මාර්ගෝපදේශන උපදේශක | 1 |
| වැඩසටහන් පද්ධති විශ්ලේෂක | 2 |
| සහකාර ජාල කළමණාකරු | 1 |
| සහකාර සංඛ්‍යාලේඛණඥ | 0 |
| පද්ධති ඉංජිනේරු | 0 |
| භෞතික අධ්‍යාන උපදේශක | 5 |
| පරිගණක තාක්ෂණ උපදේශක | 3 |
| ඉංග්‍රිසි උපදේශක | 1 |
| එකතුව | 19 |

## 08. අනධ්‍යයන කාර්යය මණ්ඩල විස්තර (ස්ථිර)

| පීඨය | විධායක ශ්‍රේණි | ජ්‍යෙෂ්ඨ ශ්‍රේණි | කණිෂ්ඨ ශ්‍රේණි | සුළු ශ්‍රේණි |
|---|---|---|---|---|
| උප කුලපති කාර්යාලය | | 1 | 1 | 2 |
| ලේඛකාධිකාරි කාර්යාලය | 1 | | 1 | 1 |
| මූලධන අංශය | 0 | 1 | 3 | 1 |
| අභ්‍යන්තර විගණනය | | 1 | 1 | 1 |
| අධ්‍යයන අංශය | 1 | 1 | 5 | 1 |
| අනධ්‍යන අංශය | 0 | 1 | 3 | 1 |
| ශිෂ්‍ය හා කාර්ය මණ්ඩල සුභසාධනය | 0 | 1 | 4 | 1 |
| විභාග සේවා | 0 | 1 | 5 | 2 |
| මූල්‍ය පරිපාලන | 1 | | 8 | 3 |
| ගබඩා හා සැපයුම් | 0 | 1 | 6 | 1 |
| ඉංග්‍රීසි භාෂා හා ඉගැන්වීමේ ඒකකය | | | 1 | 1 |
| දුරස්ත හා අඛණ්ඩ අධ්‍යයන ඒකකය | 0 | 1 | 1 | 0 |
| පරිපාලන සේවා | 0 | 1 | 6 | 23 |
| ආරක්ෂක සේවා | | | 3 | 1 |
| පරිගණක මධ්‍යස්ථානය | | | 1 | 2 |
| භෞතික අධ්‍යන අංශය | 1 | | 1 | 3 |
| කෘෂිකර්ම පීඨය | 0 | 1 | 17 | 4 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 0 | 2 | 16 | 7 |
| කළමනාකරණ අධ්‍යයන පීඨය | 0 | 2 | 9 | 11 |
| වෛද්‍ය හා සමාන්තර පීඨය | 0 | 2 | 43 | 12 |
| සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය | | 1 | 7 | 26 |
| ඉංජිනේරු ... | | | | |
| ණඩත්තු අංශය | 1 | 0 | 6 | 14 |
| ඉඩම් හා ගොඩනැගිලි | 1 | | 5 | 2 |
| සෞඛ්‍ය සේවා | | | 4 | 2 |
| නේවාසිකාගාරය | | 0 | 9 | 5 |
| පුස්ථකාල සේවා | 0 | 1 | 15 | 17 |
| වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය | | | 1 | 0 |
| කාර්ය මණ්ඩල සංවර්ධන ඒකකය | | | 1 | 0 |
| **එකතුව** | **06** | **19** | **182** | **146** |

පීඨයන්හි අනධ්‍යයන කාර්ය මණ්ඩල විස්තර වර්ෂ 03ක් තුල සාරාංශගත කරන ලද

| පීඨය | 2012 | 2013 | 2014 |
|---|---|---|---|
| කෘෂි කර්ම පීඨය | 35 | 37 | 30 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 28 | 31 | 31 |
| වෛද්‍ය හා සමාන්තර විද්‍යා | 12 | 12 | 14 |
| කළමණාකරන අධ්‍යයන | 74 | 76 | 71 |
| සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය | 14 | 15 | 15 |
| වෙනත් සේවක | 185 | 188 | 235 |
| එකතුව | 348 | 359 | 396 |



## 09. පර්යේෂණ, නව සොයාගැනීම් හා ප්‍රකාශන

| විෂය | ප්‍රකාශයට පත් කරන ලද | අලෙවි කරන ලද | ඉදිරිපත් කරන ලද |
|---|---|---|---|
| කෘෂි කර්ම පීඨය | | | |
| • පර්යේෂණ සංඛ්‍යාව | 107 | - | 14 |
| • නව සොයා ගැනීම් සංඛ්‍යාව | 02 | - | - |
| • වාර සඟරා සංඛ්‍යාව | 31 | - | - |
| • පොත් සංඛ්‍යාව | 03 | - | - |
| • ලිපි සංඛ්‍යා | 14 | - | 01 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | | | |
| • පර්යේෂණ සංඛ්‍යාව | 46 | - | 24 |
| • නව සොයා ගැනීම් සංඛ්‍යාව | 02 | - | - |
| • වාර සඟරා සංඛ්‍යාව | 37 | - | - |
| • පොත් සංඛ්‍යාව | - | - | - |
| • ලිපි සංඛ්‍යා | 64 | - | 25 |
| කළමනාකරණ අධ්‍යයන පීඨය | | | |
| • පර්යේෂණ සංඛ්‍යාව | - | - | - |
| • නව සොයා ගැනීම් සංඛ්‍යාව | - | - | - |
| • වාර සඟරා සංඛ්‍යාව | - | - | - |
| • පොත් සංඛ්‍යාව | - | - | - |
| • ලිපි සංඛ්‍යා | 39 | - | - |
| වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය | | | |
| • පර්යේෂණ සංඛ්‍යාව | 1 | - | - |
| • නව සොයා ගැනීම් සංඛ්‍යාව | 1 | - | - |
| • වාර සඟරා සංඛ්‍යාව | 43 | - | - |
| • පොත් සංඛ්‍යාව | - | - | - |
| • ලිපි සංඛ්‍යා | 45 | - | - |
| සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය | | | |
| • පර්යේෂණ සංඛ්‍යාව | - | - | - |
| • නව සොයා ගැනීම් සංඛ්‍යාව | 6 | - | - |
| • වාර සඟරා සංඛ්‍යාව | 30 | - | - |
| • පොත් සංඛ්‍යාව | 7 | - | - |
| • ලිපි සංඛ්‍යා | 28 | - | - |
| **එකතුව** | **476** | **-** | **64** |

## 10. වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු

| විෂය | සැලසුම් කරන ලද | පවත්වන ලද |
|---|---|---|
| **කෘෂිකර්ම පීඨය** | | |
| • පශ්චාත් උපාධි වැඩසටහන | 06 | 07 |
| • පශ්චාත් ඩිප්ලෝමා වැඩසටහන | - | - |
| • උපාධි වැඩසටහන | - | - |
| • ඩිප්ලෝමා වැඩසටහන | - | - |
| • සහතික පත්‍ර වැඩසටහන | - | - |
| • වෙනත් | - | - |
| **ව්‍යවහාරික විද්‍යා පීඨය** | | |
| • පශ්චාත් උපාධි වැඩසටහන | 02 | 02 |
| • පශ්චාත් ඩිප්ලෝමා වැඩසටහන | - | - |
| • උපාධි වැඩසටහන | 11 | 11 |
| • ඩිප්ලෝමා වැඩසටහන | - | - |
| • සහතික පත්‍ර වැඩසටහන | - | - |
| • වෙනත් | - | - |
| **කළමනාකරණ අධ්‍යයන පීඨය** | | |
| • පශ්චාත් උපාධි වැඩසටහන | නැගෙනහිර නුවරගම් පළාතේ උසස් පෙළ සහ පාසැල් හැර යන්නන් සඳහා සම්මන්ත්‍රන පැවැත්විම | |
| • පශ්චාත් ඩිප්ලෝමා වැඩසටහන | | |
| • උපාධි වැඩසටහන | | |
| • ඩිප්ලෝමා වැඩසටහන | | |
| • සහතික පත්‍ර වැඩසටහන | | |
| • වෙනත් | | |
| **වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය** | | |
| • පශ්චාත් උපාධි වැඩසටහන | - | - |
| • පශ්චාත් ඩිප්ලෝමා වැඩසටහන | - | - |
| • උපාධි වැඩසටහන | - | - |
| • ඩිප්ලෝමා වැඩසටහන | - | - |
| • සහතික පත්‍ර වැඩසටහන | - | - |
| • වෙනත් | - | 43 |
| **සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය** | | |
| • පශ්චාත් උපාධි වැඩසටහන | - | - |
| • පශ්චාත් ඩිප්ලෝමා වැඩසටහන | - | - |
| • උපාධි වැඩසටහන | 6 | - |
| • ඩිප්ලෝමා වැඩසටහන | - | - |
| • සහතික පත්‍ර වැඩසටහන | - | - |
| • වෙනත් | 94 | - |
| **එකතුව** | **113** | **63** |

## 11. ලැබූ ප්‍රදානයන්

| විෂය | සම්මාන සංඛ්‍යාව | අධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|
| **කෘෂිකර්ම පීඨය** | | | |
| • දේශීය සම්මාන | - | - | - |
| • ජාතික සම්මාන | 02 | 02 | - |
| • ජාත්‍යන්තර සම්මාන | 01 | 01 | - |
| • වෙනත් | - | - | - |
| **ව්‍යවහාරික විද්‍යා පීඨය** | | | |
| • දේශීය සම්මාන | - | - | - |
| • ජාතික සම්මාන | 01 | 01 | 01 |
| • ජාත්‍යන්තර සම්මාන | - | - | - |
| • වෙනත් | - | - | - |
| **කළමනාකරණ අධ්‍යයන පීඨය** | | | |
| • දේශීය සම්මාන | - | - | - |
| • ජාතික සම්මාන | - | - | - |
| • ජාත්‍යන්තර සම්මාන | - | - | - |
| • වෙනත් | - | - | - |
| **වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය** | | | |
| • දේශීය සම්මාන | 01 | 01 | - |
| • ජාතික සම්මාන | 01 | 01 | - |
| • ජාත්‍යන්තර සම්මාන | 02 | 02 | - |
| • වෙනත් | 01 | 01 | - |
| **සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය** | | | |
| • දේශීය සම්මාන | - | - | - |
| • ජාතික සම්මාන | - | - | - |
| • ජාත්‍යන්තර සම්මාන | - | - | - |
| • වෙනත් | - | - | - |
| | **09** | **09** | **01** |

## 12. නව පාඨමාලා

| පීඨය | පාඨමාලාව | මාධ්‍යය | සහතිකපත්‍ර | ඩිප්ලෝමා | පශ්චාත් උපාධි | විශේෂඥ | දර්ශනපති | ආචාර්ය |
|---|---|---|---|---|---|---|---|---|
| කෘෂිකර්ම පීඨය | | | | | | | - | 1 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | | | | | | | 3 | 2 |
| කළමනාකරණ පීඨය | | | | | | | - | - |
| වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය | | | | | | | 4 | 1 |
| සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය | | | | | | | - | - |
| එකතුව | | | | | | | 7 | 4 |

## මූල්‍ය ප්‍රගතිය

## 13. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර

| විෂය | 2013 රු. | 2014 රු. |
|---|---|---|
| පුද්ගල පඩි නඩි | 486,872,409.00 | 575,477,526.00 |
| ගමන් වියදම් | 4,117,154.00 | 6,541,682.00 |
| සැපයුම් | 39,933,418.00 | 49,400,058.00 |
| නඩත්තු වියදම් | 11,042,883.00 | 30,142,633.00 |
| ගිවිසුම්ගත සේවා | 227,877,061.00 | 224,417,492.00 |
| වෙනත් | 81,573,225.00 | 98,496,029.00 |
| **එකතුව** | **851,416,150.00** | **984,475,420.00** |

## 14. ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර

| විෂය | 2013 | 2014 |
|---|---|---|
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ අත්පත් කර ගැනීම. | 49,058,796.00 | 67,577,167.58 |
| යන්ත්‍ර උපකරණ අත්පත් කරගැනීම. | - | - |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් අත්පත් කර ගැනීම. | 405,432,287.00 | 267,370,857.33 |
| පුස්තකාල වාර සඟරා | 9,827,072.00 | 8,007,096.66 |
| වෙනත් පුරුත්ථාපන. | 13,356,104.00 | 12,986,665.00 |
| **එකතුව** | **477,674,259.00** | **355,941,786.57** |

## 15. (දේශීය/විදේශීය අරමුදල්) ව්‍යාපෘති විස්තර

**TCE=RFA+DF**

| විස්තර | ණය/ ප්‍රදාන | අරමුදල් සපයන ආයතන | **TEC රු.** | **RFA රු.** | **DF රු.** |
|---|---|---|---|---|---|
| HETC | ප්‍රදාන | World Bank | 252,160,000.00 | 226,944,000.00 | 25,216,000.00 |
| NCAS- දර්ශනපති | ප්‍රදාන | UGC | 4,231,000.00 | | 4,231,000.00 |
| අධ්‍යයන පර්යේෂණ | ප්‍රදාන | RUSL | 20,000,000.00 | | 20,000,000.00 |
| Research title for elephant studies | Grant | Ringing Brothers | 546,900.00 | 546,900.00 | |
| Asian Elephant T.B | Grant | National Zoological Garden | 348,438.75 | | 348,438.75 |
| WHO Research Grant | Grant | WHO | 2,814,940.00 | 2,814,940.00 | |
| Oxfam Project | Grant | Australia | 3,199,758.00 | 3,199,758.00 | |
| එකතුව | | | 283,301,036.75 | 70,192,372.00 | 49,795,438.75 |

**TEC – Total Estimate Cost** **RFA - Reimburse Foreign Aid** **DF- Domestic Fund**

## 16. ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර (දේශීය/ විදේශීය අරමුදල්)

| විස්තරය | TCE රු | 2013 වියදම් | 2014 වියදම් | 2014.12.31 දිනට සමුච්චිත වියදම් |
|---|---|---|---|---|
| HETC | 252,160,000.00 | 57,182,194.00 | 141,868,806.00 | 199,051,000.00 |
| NCAS - දර්ශනපති | 4,231,000.00 | 4,148,367.00 | 3,066,800.00 | - |
| අධ්‍යයන පර්යේෂණ | 20,000,000.00 | 7,000,000.00 | 14,410,000.00 | - |
| WHO Research Grant | 2,814,940.00 | 480,000.00 | 1,246,048.00 | 1,726,048.00 |
| Oxfarm Project | 3,199,758.00 | 1,381,811.00 | 998,320.00 | 3,050,565.00 |
| Total | **283,301,036.75** | 70,192,372.00 | 161,589,974.00 | 203,827,613.00 |

## 17. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්)

| | ප්‍රතිපාදන 2014 | 2014 වියදම් | ඉතුරුම් |
|---|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | 919,000,000.00 | 984,475,420.00 | (65,475,420.00) |
| **ප්‍රාග්ධන වියදම්** | 450,200,000.00 | 355,941,786.57 | 94,258,213.43 |
| **දේශීය අරමුදල්** | - | 159,345,606.00 | - |
| **විදේශීය අරමුදල** | - | 2,244,368.00 | - |
| **එකතුව** | 1,369,200,000.00 | 1,502,007,180.57 | 28,782,793.43 |

## 18. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (ඉපැයූ ආදායම්)

| විෂය | 2012 වසරේ ආදායම රුපියල් | 2013 වසරේ ආදායම රුපියල් | 2014 වසරේ ආදායම රුපියල් |
|---|---|---|---|
| උපාධි අපේක්ෂක අධ්‍යයන | 1,000,000.00 | 2,761,268.00 | 1,761,268.00 |
| බාහිර උපාධි වැඩ සටහන් | | | |
| ඩිප්ලෝමා | | | |
| පශ්චාත් උපාධි අධ්‍යයන | 15,000,000.00 | 56,736,935.00 | 41,736,935.00 |
| සහතික පත්‍ර පාඨමාලා | | | |
| උපදේශන | | | |
| වෙනත් | 9,000,000.00 | 16,020,043.00 | 7,020,043.00 |
| එකතුව | **25,000,000.00** | **75,518,246.00** | **50,518,246.00** |

## 19. මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය 2014

| විෂය | පීඨය | | | | |
|---|---|---|---|---|---|
| | වෛද්‍ය පීඨය | ව්‍යවහාරික විද්‍යා පීඨය | කෘෂිකර්ම පීඨය | කළමනාකරණ අධ්‍යයන පීඨය | සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය |
| එක් සිසුවෙකු සඳහා පුනරාවර්තන වියදම | 258 | 258 | 374 | 185 | 175 |
| එක් සිසුවෙකු සඳහා ප්‍රාග්ධන වියදම | 74 | 54 | 27 | 106 | 93 |
| **එකතුව** | 332 | 312 | 401 | 291 | 268 |

- **රුපියල් දහස් වලින්000**

## 20. ඉදිකිරීම් සඳහා වූ අරමුදල් 2014

| යටිතල පහසුකම් | වියදම් (Rs) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|
| සායනික ගොඩනැගිලි සංකීර්ණය වෛද්‍ය හා සමාන්තර පීඨය I පියවර අනුරාධපුර<br>සායනික ගොඩනැගිලි සංකීර්ණය වෛද්‍ය හා සමාන්තර පීඨය II පියවර අනුරාධපුර (Specialized Works)<br>සායනික ගොඩනැගිලි සංකීර්ණය වෛද්‍ය හා සමාන්තර පීඨය –සායනික උපකරණ සවිකිරීම | 48,558.00 | 100 |
| සමාජ විද්‍යා පීඨ ගොඩනැගිල්ල | 24,270.00 | 100 |
| යෝජිත ගොඩනැගිලි සංකීර්ණය කළමණාකරන පීඨය | 63,909.00 | 60 |
| Para සායනික ගොඩනැගිලි සංකීර්ණය වෛද්‍ය හා සමාන්තර පීඨය | 846.00 | 100 |
| සිසුන් 250 දෙනෙකු සඳහා නේවාසිකාගාරය පුලියන්කුලම කෘෂිකර්ම පීඨය | 48,931.00 | 40 |
| සායනික ගොඩනැගිලි සංකීර්ණය කෘෂිකර්ම පීඨය | 11,018.00 | 10 |
| දැයට කිරුළ - ව්‍යාපෘති i | 79,320.00 | 50 |
| - ව්‍යාපෘති ii | 42,772.00 | 60 |
| ඉඩම් සහ ගොඩනැගිලි අත්පත් කරගැනීම් | 1,400.00 | 10 |
| පිහිනුම් තටාක | 504.00 | 5 |
| පෙරනිමැවුම් ආකාරයේ දේශන ගොඩනැගිල්ලක් ව්‍යවහාරික විද්‍යා පීඨය | 15,847.00 | 50 |
| නේවාසිකාගාර ව්‍යාපෘතිය iii (MOHE) | 22,214.00 | 80 |
| Total | 359,589.00 | |

# ඇමුණුම - A

## 21. කෘෂි කර්ම පීඨය



### හැඳින්වීම

ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලයේ කෘෂි විද්‍යා පීඨය වර්ෂ 2001 දී සිව්දෙනෙකුගෙන් සමන්විත අධ්‍යයන මණ්ඩලයකින් සහ උපාධි අපේක්ෂකයින් 17 දෙනෙකුගෙන් ආරම්භ කරන ලදි. මෙහි ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවේ වියළි කළාපයට යෝග්‍ය වූ කෘෂි කාර්මික ක්‍රම පිළිබඳ අවධානය යොමු කරමින් විශේෂ උපාධි පාඨමාලා 04ක් පිරිනමනු ලබයි. විවිධ කෘෂි විද්‍යා ක්‍රම පදනම් කර ගනිමින් මෙම පාඨමාලා වර්ෂ අර්ධයන් 08කින් සමන්විතව පවති. අද වන විට **කෘෂි ඉංජිනේරු සහ පාංශු විද්‍යා, කෘෂි කර්ම පද්ධති, සත්ව ආහාර විද්‍යාව සහ ශාක විද්‍යාව** යන අධ්‍යයන අංශ 04කින් ද පරිගණක ඒකකය, ඉංග්‍රිසි භාෂා පුහුණු අංශය, පීඨ ගොවිපළ හා පුස්තකාලයකින් ද යුක්ත වේ. පාංශු විද්‍යා, ශාක විද්‍යා ජීව, රසායන විද්‍යා සහ GIS රසායනාගාර සමඟ පැවැත්වෙන කෘෂි ඉංජිනේරු වැඩ මුළු මඟින් උපාධි අපේක්ෂකයන්ගේ විශ්ලේෂණ හා අනෙකුත් කුසලතා වර්ධනය සඳහා අවස්ථාවන් සලසනු ලැබේ.

වසරකට කෘෂි විද්‍යා පීඨයට සිසුන් 120 පමණ ඇතුලත් වන අතර එම සියළුම දෙනා සඳහා නේවාසිකාගාර පහසුකම් සලසා දෙනු ලැබේ. වර්තමානයේදි කෘෂිවිද්‍යා පීඨය දැනට 70 අධික අධ්‍යයන සහ අනධ්‍යයන සේවක මණ්ඩලයකින් සමන්විත වේ.

මෙම උපාධි පාඨමාලා මූලික වැඩ සටහනකින් සහ විශේෂිකරණ අංගවලින් සමන්විත වන අතර මූලික වැඩසටහන් සියළුම සිසුන් සඳහා අනිවාර්ය වන අතර එය පළවෙනි වර්ෂාර්ධ 05තුල විසිරි ඇත. 06වන සහ 07වන වර්ෂාර්ධයන්වල සිසුන්ට ඔවුන්ගේ රුචිකත්වය පරිදි විශේෂිකරණ අංග තෝරාගත හැක. අවසන් වර්ෂාර්ධයේදි සිසුන් විසින් ඒකල පරික්ෂණ ව්‍යාපෘතියක් තෝරා ගත යුතු අතර විස්තර සහිත පරික්ෂණ වාර්තාවක් ඉදිරිපත් කල යුතුය.

### ජයග්‍රහණයන්

- පීඨයේ 04වන අධ්‍යයන අංශය වශයෙන් සත්ව හා ආහාර විද්‍යා අංශය ආරම්භ කිරිම.
- පාඨමාලාවට අදාල විෂය කරුණු සහ අන්තර්ගත කුසලතාවන් යාවත්කාලීන කිරිම.
- චින සංස්කෘතික විශ්ව විද්‍යාලය සමඟ අධ්‍යයන සහ අධ්‍යාපන අවශ්‍යතා හුවමාරු කර ගැනිමේ අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබිම.
- 06 වන වාර්ෂික පරික්ෂණ ශාස්ත්‍රීය සම්මන්ත්‍රණය පැවැත්වීම සහ ප්‍රකාශයට පත්කිරිම.

### අසමර්ථයන් සහ සාධනයන්

- කොන්ත්‍රාත්කරුගේ නොකැපවීම නිසා ගැහැණු නේවාසිකාගාරයේ වැඩ කටයුතු අවසන් කිරිමට නොහැකි වීම.
- ගැසට් නිවේදනයන් නිකුත්කිරිම පමා වීම නිසා පීඨය පුළුල් කිරිමට අවශ්‍ය භූමියක් ලබා ගැනිම පමා වීම.

- ඕස්ට්‍රේලියාවේ විශ්ව විද්‍යාලයකින් පිරිනමන ලද (සහකාර තනතුරක් නිසා) දර්ශන අතිඋපාධියක් සහිත ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයෙක් පියය අතහැර යාම.

**<u>අනාගත සැලසුම්</u>**

- පශ්චාත් උපාධි පාඨමාලා ක්‍රියාත්මක කිරිම.
- ගොවි ප්‍රජාව සහ උසස් පෙළ සිසුන් සඳහා වැඩ මුළු හා පුහුණු වැඩ සටහන් පැවැත්විම.
- ජාතික සහ අන්තර්ජාතික අධ්‍යයන ආයතන සමඟ සහයෝගීතාවයෙන් පරික්ෂණ ව්‍යාපෘති සිදු කිරිම.
- උපාධි අපේක්ෂකයින් සඳහා කාර්මික පුහුණු වැඩ සටහන් ආරම්භ කිරිම.
- අධ්‍යයන අංශ 04 ස්ථාපනය සඳහා ගොඩනැගිලි සංකිර්ණයක් ඉදිකිරිම.
- සියළුම සිසුන් සඳහා නේවාසික පහසුකම් සැපයිම සඳහා නේවාසිකාගාරයක් ඉදිකිරිම.

## 22. ව්‍යවහාරික විද්‍යා පීඨය



ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයේ දැක්ම වනුයේ, විශ්ව විද්‍යාලීය දැක්ම සමග යමින් ජාතික අවශ්‍යතාවයන්ට අනුව ජාත්‍යන්තර පිළිගැනීම යටතේ විවිධ ව්‍යවහාරික විද්‍යා අංශ ඔස්සේ විශිෂ්ඨ වූ ඉගැන්වීම්, පරීක්ෂණ, පුහුණු උපදේශන සඳහා වූ ක්‍රියාශීලී නවෝත්පාදන සහිත කීර්තිමත් මධ්‍යස්ථානයක් ඇති කිරීමයි . මෙහි මෙහෙවර වන්නේ සියලුම විශ්ව විද්‍යාල සාමාජිකයන් ඉගෙනුම්, පරීක්ෂණ හා පුහුණු මඟින් කර්මාන්ත සහ ජන සමූහයාගේ ප්‍රාදේශීය, ජාතික හා විශ්ව අවශ්‍යතා වෙනුවෙන් සුවිශේෂී දායකත්වයක් සැපයීමට පෙළඹවීමයි.

වර්තමානයේ විශ්ව විද්‍යාත්මක සංවර්ධනයේ අභියෝගවලට මුහුණදීමට අවශ්‍ය දැණුමෙන් සහ කුසලතාවන්ගෙන් යුක්ත වූ උපාධිධාරීන් රටතුල බිහි කිරීම අපගේ ප්‍රධාන අරමුණයි. එබැවින් ව්‍යවහාරික විද්‍යා ක්ෂේත්‍රයේ කුසලතාවලින් හෙබි පුළුල් සමාජයට නිරාවරණය වූ උපාධිධාරීන් බිහිකිරීම සඳහා ක්‍රමවේදයක් නිර්මාණය කිරීම පීඨයේ මූලික පරමාර්ථය වේ . එම අරමුණ ලඟා කර ගැනීම සඳහා ඉංග්‍රිසි භාෂා සහ පරිගණක සාක්ෂරතාවය වැඩි දියුණු කිරීම, වෘත්තිය උපදේශ ඒකකයක් ස්ථාපනය කිරීම ආදි වෙනත් ක්‍රමෝපායන් ද භාවිතා කරයි .

ව්‍යවහාරික විද්‍යා පීඨයේ භෞතික විද්‍යා හා ජීව විද්‍යා යන අධ්‍යයන අංශයන්ගෙන් සමන් විතය. ජීව විද්‍යා අංශය මගින් ශාක විද්‍යාව සහ සත්ව විද්‍යාව සෞඛ්‍ය ප්‍රවර්ධන පාඨමාලාවන් පවත්වනු ලබයි. භෞතික විද්‍යා අධ්‍යන අංශය මගින් පරිගනක විද්‍යාව, ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය, භෞතික විද්‍යාව, රසායනික විද්‍යාව සහ තොරතුරු හා සන්නිවේදනය යන පාඨමාලා යෝජනා කර ඇත.

| වර්ගය | විස්තරය | අපේක්ෂිත කණ්ඩායම |
|---|---|---|
| වැඩ මුළු | උසස් පෙල ජීව විද්‍යා අංශය සඳහා වැඩ මුළු | පාසල් සිසුන් සඳහා |
| | අධ්‍යාපන පටිපාටි සංශෝධනය ව්‍යවස්ථාව | පෞද්ගලික අංශය, රාජ්‍ය නොවන, රාජ්‍ය අංශය, විශ්ව විද්‍යාල |
| | පෙර පාසල් සුබ සිද්ධිය | පෙර පාසල් ගුරුවරු |
| | සමාජ සුභ සිද්ධිය වර්ධනයට සෞඛ්‍ය ප්‍රවර්ධනයේ ප්‍රවේශය | සමාජීය සාමාජිකයන් |
| පුහුණු වැඩසටහන් | සිංහරාජ ක්ෂේත්‍ර වැඩ | උපාධි අපේක්ෂකයන් |
| | පක්ෂි ක්ෂේත්‍ර තාක්ෂණික වැඩසඳහා ආධුනිකයින් | උපාධි අපේක්ෂකයන් |
| | ජලජ ජීවීන් බෝ කිරීමේ පුහුණු වැඩසටහන් | උපාධි අපේක්ෂකයන් |
| | වෛද්‍ය සහ ආර්ථික පුහුණු වැඩසටහන් | උපාධි අපේක්ෂකයන් |
| | විසිතුරු මත්ස්‍ය වගාව පිළිබඳ පුහුණුව | උපාධි අපේක්ෂකයන් |
| | මත්ස්‍ය සෞඛ්‍ය කලමනාකරණය වන සංරක්ෂණ, කෘමින් ආරක්ෂා කිරීම | උපාධි අපේක්ෂකයන් |
| | ජලජ ජීවී තාක්ෂණික ක්‍රම පුහුණු වැඩ සටහන් | උපාධි අපේක්ෂකයන් |
| | සංස්කෘතික හා විසිතුරු ශාක ව්‍යාප්ති | උපාධි අපේක්ෂකයන් |
| | ජීව විද්‍යාත්මක විවිධ ක්ෂේත්‍ර ක්‍රම | උපාධි අපේක්ෂකයන් |
| ප්‍රදර්ශන | P.B කරුනාරත්න සිහිකිරීමේ ප්‍රදර්ශනය | පාසල් සිසුන් සඳහා |
| රේඩියෝ වැඩසටහන් | වෛද්‍ය මනෝජ් ප්‍රනාන්දු T.V වැඩ සටහන් | |
| | T.V දෙරන වැඩ සටහන රේඩියෝ වැඩසටහන් | |
| | SLBC වැඩසටහන් | |

**අනාගත සැලසුම්**

- සෞඛ්‍ය ප්‍රවර්ධන අධ්‍යයන අංශය ඇති කිරිම.
- පාරිසරික විද්‍යාගාර ඇති කිරිම. - උපකරන මිළදි ගැනිම

  AAS

  TOC විශ්ලේෂණය
- ප්‍රජාව සඳහා හුවමාරු තාක්ෂන වැඩමුළු පැවැත්විම
- නව ක්‍රියාකාරකම් හදුන්වා දිම (ධිවර යන පටක රෝපන)
- පිඨයේ ඉලෙක්ට්‍රොනික සඟරාව පල කිරිම හා අනෙකුත් පිඨයන්ට ප්‍රවිශ්ඨවිමේ හැකියාව ලබා දිම
- වෙනත් විශ්ව විද්‍යාල සමඟ පර්යේෂණ පරික්ෂණ සම්මන්ත්‍රන සංවිධානය කිරිම
- INGOS කාර්‍ය මණ්ඩල සමාජිකයන් සඳහා (සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩ සටහන්) සංවිධානය කිරිම
- කාර්‍ය මණ්ඩලය සහ සිසුන් සදහා පුහුණු වැඩ සටහන් හදුන්වා දිම කැනඩාවේ විශ්ව විද්‍යාලය පවා පරික්ෂණ සහයෝගීතාවය හා හුවමාරු වැඩසටහන්
- සිංගප්පුරුවේ Lee Change වෛද්‍ය පාසල සමග සහයෝගිතාවයෙන් ප්‍රජා සමික්ෂණයන් සංවිධානය කිරිම
- පේරාදෙණිය වෛද්‍ය පිඨය සමඟ සහයෝගීතාවයෙන් CKD පරික්ෂණ සමික්ෂනයන් සංවිධානය කිරිම

**භෞතික විද්‍යා අංශය**

**ලගා කර ගැනිම්**

- HETC ව්‍යාපෘති QIS ප්‍රතිපාදන මගින් රුපියල් මිලියන 25 ක් මෙම දෙපාර්තමේන්තු ව්‍යාපෘතිය ලබා ගැනිම හා 2014 දි ක්‍රියාත්මක කිරිම.
- නැ.නු.ප උසස් පෙළ සිසුන් 2000 වඩා වැඩි පිරිසකට වැඩ මුලු සදහා සහාභාගි කිරිම .
- ඡෙෂ්ඨ කථිකාචාර්‍යවරුන් භෞතික විද්‍යාව සදහා පත් විසි ලබා දිම .
- පර්යේෂණ ක්‍රමවේද යන තාක්ෂණ වැනි පුහුණු වැඩ සටහන් සදහා 200 වැඩි සිසුන් පිරිසක් සහාභාගි විම.
- ICT පුහුණු වැඩ සටහන් සඳහා 100 අධික පිරිසක් සිසුන් සහභාගි වි තිබේ .
- පරික්ෂණාගාර සදහා අවශ්‍ය උපකරන මිලියන 4.5 පමණ වැය කර ලබා ගෙන ඇත .
- උපුටා ගැනිම්, සඟරා, පර්යේෂණ ලිපි දේශියව හා විදේශියව පල කර තිබේ .
- එයින් ඡෙෂ්ඨ ආචාර්වරයෙක් විසින් ඡනාධිපති සම්මානයද ලබා ගෙන ඇත .
- අධ්‍යයන කාර්ය මණ්ඩල සමාජිකයෙක් විසින් පශ්චාත් උපාධිය නිමා කර නැවත සේවය සඳහා පැමිණ ඇත.

**අනාගත සැලසුම්**

- පරිගනක අධ්‍යයන අංශය පිහිටුවිම.
- නව තාක්ෂණික උපාධි පාඨමාලා පිඨය තුල හඳුන්වා දිම.
- නව උපාධි පාඨමාලා හඳුන්වා දිම - රසායන විද්‍යා විශේෂ උපාධිය

  භෞතික විද්‍යා විශේෂ උපාධිය

- ❖ බිමට ගන්නා ජලයෙහි තත්ව පරික්ෂාව සඳහා පරික්ෂණාගාරයක් පිහිටුවීම.
- ❖ පර්යේෂණ සඳහා අවශ්‍ය උපකරණ සහ අනෙකුත් පහසුකම් සැලසීම.
- ❖ පුරප්පාඩුව පැවති අධ්‍යයන කාර්ය මණ්ඩල පහසුකම් සැපයීම.
- ❖ ICT / CS සම්මන්ත්‍රණ පැවැත්වීම. (රසායන විද්‍යාව, සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව)

## 23. කළමණාකරන අධ්‍යයන පීඨය



1996 දි පිහිටන ලද අධ්‍යයන අංශ තුනකින් සමන්විත කලමණාකරන අධ්‍යයන පීඨයේ මූලික අරමුණ වනුයේ සාම්ප්‍රධායික අධ්‍යයන වැඩසටහන් වෙනුවට රැකියා මූලික කරගත් උපාධි පාඨමාලා හඳුන්වා දීමයි. මෙහි අධ්‍යයන අංශ තුනකින් මූලික වශයෙන් වර්ෂ තුනේ උපාධි පාඨමාලා තුනක් පිරිනමනු ලැබිය. නමුත් 2004 දි විශේෂ උපාධි පාඨමාලාවක් හඳුන්වා දිමෙන් පසුව මෙම උපාධි පාඨමාලා වර්ෂ හතර දක්වා දීර්ඝ කරන ලදි. ශ්‍රී ලංකාවේ රාජ්‍ය සහ පෞද්ගලික අංශවල ආයතන අවශ්‍යතාවයන්ට ගැලපෙන පුද්ගලයන් බිහි කිරිමේ අරමුණින්ය.

කලමණාකරන පිඨය මගින් ව්‍යාපාර කලමණාකරණ උසස් උපාධිය යන පශ්චාත් ඩිප්ලෝමා කලමණාකරන උපාධිය පිරිනමනු ලබයි. තව ද 2013 වර්ෂයේ දි වසර 03ක උපාධි වැඩ සටහනක් හඳුන්වා දෙන ලදි.

### <u>දැක්ම</u>

කළමනාකරණ අධ්‍යයන පිඨයේ දැක්ම වනුයේ, උසස් තත්වයකින් යුත් කළමනාකරණ අධ්‍යාපනයක් ලබාදිම, නායකත්ව හා ප්‍රායෝගික කුසලතා සංවර්ධනය හා වෙනස්වන සමාජය පිලිබද අවධානය යොමු කරමින් පරික්ෂන සිදු කිරිම.

කළමණාකරන විද්‍යා පිඨයේ අධ්‍යන අංශ 03 කින් සමන්විත වන අතර උපාධි පාඨමාලා 04 ක් මෙමගින් පවත්වනු ලබයි.

**ගණකාධිකරන සහ මූල්‍ය අංශය - ගණකාධිකරන සහ මූල්‍ය විශේෂ උපාධිය (B.Sc.)**

**ව්‍යාපාර කළමනාකරන අංශය - ව්‍යාපාර තොරතුරු තාක්ෂණය විශේෂ උපාධිය (B.Sc.)**

**සංචාරක සහ ආගන්තුක සත්කාර කළමණාකරන අංශය - සංචාරක සහ ආගන්තුක සත්කාර කළමණාකරන විශේෂ උපාධිය (B.Sc.)**

තව දුරටත් පහත දැක්වෙන පශ්චාත් උපාධි පාඨමාලා පවත්වනු ලබයි.

1. පශ්චාත් උපාධි කළමණාකරන ඩිප්ලෝමා (PGDM)
2. උසස් උපාධි ව්‍යපාර පරිපාලන (MBA)

කළමණාකරන පිඨය මගින් ව්‍යාපාර පරිපාලන පශ්චාත් බාහිර උපාධි පාඨමාලාවද පවත්වනු ලබයි.

### <u>ලගාකරගැනිම්</u>

කලමණාකරන අධ්‍යයන අංශය මගින් 2014 වර්ෂයේදි “Journal of Management Matters” යන ජර්නලය කරන ලදි. ඊට අමතරව පහත දැක්වෙන ලගා කර ගැනිම් ඒ ඒ අධ්‍යන අංශ මගින් ලබා ගන්නා ලදි.

**ව්‍යාපාර කළමණාකරන අංශය**

- එක් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු දර්ශනපති උපාධිය සම්පූර්ණ කර නැවත සේවයට පැමිණීම.
- තවත් අයෙකු දර්ශනපති උපාධිය සඳහා කොළඹ විශ්ව විද්‍යාලයේ ලියාපදිංචි වී ඇත.
- චිනයේ Wohan තාක්ෂණ විශ්ව විද්‍යාලය සඳහා කථිකාචාර්යවරයෙකුට Ph.D ශිෂ්‍යත්වයක් ද ලැබී ඇත.

**සංචාරක සහ ආගන්තුක සත්කාර කළමණාකරන අංශය**

- 2014 වර්ෂයේ දි අධ්‍යන අංශයේ කාර්ය මණ්ඩලය සඳහා දර්ශනපති උපාධි හිමි කථිකාචාර්ය වරයෙකු ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වරයෙකු ලෙස පත් කිරීම මගින් අධ්‍යන අංශයේ ශක්තිය වැඩි දියුණු කිරිමට හැකිවිම.
- 2013 ලැබුන තත්ව හා නවෝත්පාදන ප්‍රසම්පාදන උපාධි අපේක්ෂකයන්ගේ ප්‍රායෝගික කුසලතා සංවර්ධනයට අවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරිම සඳහා යොදවන ලදි. (අධ්‍යන අංශය විසින් අවබෝධතා ගිවිසුම් 8ක් හෝටල සහ සංචාරක නියෝජිතයින් සමඟ)
- අභ්‍යන්තර පුහුණු සහ අභ්‍යන්තර ස්ථානගත කිරීම් සඳහා අත්සන් කරන ලදි.

**<u>අසමර්ථයන් සහ සාධනයන්</u>**

**සංචාරක සහ ආගන්තුක සත්කාර කළමණාකරන**

Open Window System යටතේ අධ්‍යනය ලැබූ බොහෝමයක් සිසුන් භාෂා දැනුමේන් සහ ප්‍රායෝගික ගැටලු නිසා දූර්වල ප්‍රගතියක් පෙන්විම.

<u>අනාගත දැක්ම</u>

2015 වසරේදි නව ගොඩනැගිලි සංකීර්ණ විවෘත කිරිමට බලාපොරොත්තු වේ. මීට අමතරව ඒ ඒ අධ්‍යන අංශය සඳහා පහත දැක්වෙන අරමුණ 2015 දි සම්පූර්ණ කිරිමට බලාපොරොත්තු වේ.

**ව්‍යාපාර කළමණාකරන අංශය**

- අලෙවිකරන කළමණාකරන උපාධි පාඨමාලාව සහ මානව සම්පත් කළමණාකරන උපාධි පාඨමාලාව යන නව පාඨමාලා හඳුන්වා දීම.
- විදේශිය විශ්ව විද්‍යාල හා එක්ව වැඩසටහන් ඇති කිරිම.
- ව්‍යාපාර සංවර්ධන මධ්‍යස්ථානය පිහිටුවිම.

**සංචාරක සහ ආගන්තුක සත්කාර කළමණාකරන අංශය**

පරිවාස කථිකාචාර්යවරුන් දෙදෙනෙකු බඳවා ගැනිම මගින් අධ්‍යන කාර්‍ය මණ්ඩලයේ ශක්තිය වැඩි දියුණු කිරිම සහ වැඩි ඡන්දයෙන් සම්මත කරන ලද නව අධ්‍යන පටිපාටි හා විකල්ප පාඨමාලා 2015 දි හඳුන්වා දිම. අධ්‍යයන අංශ විසින් සුදුසු සිසුන් ඇතුලත් කරගැනිම සඳහා නව සිසුන් බඳවා ගැනිමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම. කර්මාන්ත සමඟ පවතින සම්බන්ධතා ශක්තිමත් කිරිමට සංචාරක හා ආගන්තුක සත්කාර කලමණාකරන ඩිප්ලෝමාවක් හඳුන්වාදිමට අපේක්ෂා කරනු ලැබේ.

# 24. වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය



2007 ඔක්තොම්බර් 09 වන දින 1,518/15 ගැසට් පත්‍රයට අනුව 2008 සැප්තැම්බර් 08 වන දින ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලයේ වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය පිහිටුවන ලදි. ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය මඟින් බිහි කරන ලද වෛද්‍යවරුන් 751 දෙනෙකු දේශියව හා විදේශියව සේවය කරති. වර්තමානයේ මෙම පීඨයෙහි විදේශිය සිසුන් 10 දෙනෙකු අධ්‍යායන කටයුතුවල නිරතව සිටි.

**<u>ලගාකර ගැනිම්</u>**

2014 වර්ෂයේ දි නව පරිවාස කථිකාචාර්ය වරුන් පස්දෙනෙකු බඳවා ගැනිම් සිදුකරන ලදි. වෛද්‍ය H.T.W විරකෝන්, වෛද්‍ය S.M.A ජයවර්ධන යන පරිවාස කථිකාචාර්යවරුන් ඔවුන්ගේ දර්ශනපති උපාධිය 2014 වර්ෂයේ දි සම්පුර්ණ කරන ලදි.

පහත දැක්වෙන අධ්‍යයන කාර්‍ය මණ්ඩල සමාජිකයන් දර්ශනපති සහ ආචාර්ය උපාධිය (Mphil & Ph.D) සඳහා පරික්ෂණ ආචාර්ය ධර්ම සහ උසස් උපාධි කමිටුවේ ලියාපදිංචි වෙන ලදි.

දර්ශනපති (Mphil)

- වෛද්‍ය T.C අගම්පොඩි අනුරාධපුර දිස්ත්‍රික්කයේ මානව සෞඛ්‍යයට සමාජ මුලික සම්බන්ධතාවය තක්සේරු කිරිමට මෙවලමක් ලෙස සංස්කෘතික අනුවර්තනය හා සනාථ කිරිම
- චර්ම රේඛායනය - වෛද්‍ය B.T.B විජේරත්න. - ශ්‍රී ලංකාවේ හඳුනා නොගත් නිදන්ගත වකුගඩු රෝගය විනිශ්චයට ක්‍රමවේදයක් ලෙස
- W.A.S.M.D විරසිංහ මහතා - අනුකුලතා දක්වන අනුපුරක පෝෂකයන්ගේ දැනුම ආකල්ප හා පුහුණුව තක්සේරු කිරිමට ක්‍රමයන් වැඩි දියුණු කිරිම

ආචාර්ය (Ph.D)

විෂ විද්‍යාව - වෛද්‍ය M.A.C.S ජයසුමන - ශ්‍රී ලංකාවේ විෂ රසායන ආහාවය

| | |
|---|---|
| • පර්යේෂණ සංඛ්‍යාව | 1 |
| • නව සොයා ගැනීම් සංඛ්‍යාව | 1 |
| • ජර්නල ලිපි සංඛ්‍යාව | 43 |
| • පොත් සංඛ්‍යාව | - |
| • ලිපි සංඛ්‍යා | 45 |

**<u>අසමර්ථයන් සහ සාධනයන්</u>**

අධ්‍යයන සේවක මණ්ඩලයේ පවතින පුරප්පාඩු 67 සඳහා සුදුසුකම් සහිත පුද්ගලයින් බදවා ගැනිමට දැන්විම් පල කලද එක් පුද්ගලයකුවත් බදවාගත නොහැකි වුයේ සමාන වෘත්තිකයකුට විශ්ව විද්‍යාලය මඟින් ලබාදෙන පහසුකම් සෞඛ්‍ය අමාත්‍යංශය විසින් ලබාදෙන පහසුකම්වලට වඩා අඩු බැවිනි.

**<u>අනාගත දැක්ම</u>**

- සිසුන් සඳහා නේවාසිකාගාරයක් ඉදිකිරීම
- අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා නිලනිවාස ඉදිකිරීම
- නව පෙර සායන ගොඩනැගිල්ලක් ඉදිකිරීම
- පීඨ භූමි ප්‍රදේශයට හා මහාචාර්ය ඒකකය සඳහා wi-fi පහසුකම් වැඩිකිරීම
- පීඨ වෙබ් අඩවියේ තත්වය ඉහළ නැංවීම
- MBBS පාඨමාලාවේ අධ්‍යයන පටිපාටිය සම්පූර්ණ කිරීම
- පීඨයේ භූමි පරිශ්‍රය අලංකරනය කිරීම

# 25. සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය



1995 විශ්ව විද්‍යාලය ආරම්භයත් සමගම සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය ආරම්භ කරන ලදි. පීඨය මගින් පුරාවිද්‍යා හා උරුමයන් කළමණාකරනය ඉතිහාසය, සිංහල, පරිසර කළමණාකරනය සහ ආර්ථික විද්‍යාව යන අංශ පහක් සමාන්‍ය උපාධි මෙන්ම විශේෂ උපාධි පිරිනමනු ලබයි. සාමාන්‍ය මූලික කලා උපාධි හා විශේෂ කලා උපාධි මෙම පීඨයේ අධ්‍යයන අංශ 03ක් ඇති අතර ඒවා අධ්‍යයන කාර්ය මණ්ඩල සමාජිකයන් 56 කින් ද සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල සමාජිකයන් 15කින් සමන්විත වේ. වර්තමානය වන විට සිසුන් 1300 ඉහත සඳහන් කරන ලද උපාධි පාඨමාලා හදාරමින් සිටි. පීඨය මගින් ජාතික හා විශ්ව ඉල්ලුමට හා අවශ්‍යතාවයනට අනුකූලව න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුමින් සමන්විත උපාධිධාරින් පිරිසක් බිහිකිරිම සිදුකරයි. අධ්‍යයන ව්‍යුහය සහ පිහිටිම පීඨයේ දැක්මට විශේෂයන් සම්පාදනය කරයි.

**<u>ලගාකර ගැනිම්</u>**

01. 2014 වර්ෂයේ පීඨය මගින් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් දෙදෙනෙකු සහ පරිපාලන නිලධාරියෙකු සේවයට බඳවා ගත් අතර කථිකාචාර්යවරුන් දෙදෙනෙකු විසින් ආචාර්ය උපාධිය සම්පූර්ණ කර ඇත.

02. 21වන ශතවර්ෂය සඳහා වූ උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය(HETC) තත්ව හා නවෝත්පාදන ආධාර මුදල දෙවන වටයේ පළමු රාමුවෙන් (GIS) වෙන් කරන ලද ශ්‍රී ලංකා රුපියල් මිලියන 20ක මුදලක් ලැබුණි. මෙම ව්‍යාපෘතිය යටතේ පහත සඳහන් ක්‍රියාකාරකම් තුන සම්පූර්ණ කරන ලදි.

- සිසුන්ගේ පාඨමාලා තෝරා ගැනිමේ අවස්ථා වැඩි කිරිම.
- ඉගැන්විම් ඉගෙනුම් හා ඇගයුම් වැඩි දියුණු කිරිම.
- විශ්ව විද්‍යාලය සහ කර්මාන්ත අතර සබඳතාව වැඩි කිරිම.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්, විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂයපථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.
මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණය කළ මතය සඳහා පදනම

------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

(ඇ) කෘෂිකර්ම පීඨයේ කිරි හා මස් සැකසුම් මධ්‍යස්ථානයට අදාලව ගෙවන් ලද රු.875,407 ක්වූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් අයකරගෙන තිබුණු නමුත්, එය කෙරීගෙන යන වැඩ යටතේ දක්වනවා වෙනුවට තවදුරටත් අත්තිකාරම් ලෙස දක්වා තිබුණි.

(ඈ) ඉදිරි වර්ෂය සඳහා ගෙවන ලද රු. 483,068 ක ගෙවල් කුලී සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයේදී ජාතික විද්‍යා පදනමේ ප්‍රදානයක් වශයෙන් ලැබී තිබූ අරමුදලින් මිලදීගත් වත්කම් ප්‍රාග්ධනිත කිරීම වෙනුවට ප්‍රදාන ගිණුමින් අඩුකර දක්වා තිබුණි. මේ අනුව මිලදීගෙන තිබූ වත්කම් වටිනාකම වූ රු.1,750,000 ක් වත්කම් ලෙස නිරූපනය නොවූ අතර රාජ්‍ය ප්‍රදානයන්ද එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. මෙම තත්ත්වය මත වත්කම් වෙනුවෙන් ක්ෂය ප්‍රතිපාදනයද සිදුකර නොතිබුණි.

(ඊ) උප කුලපති නිල නිවස වටා තාප්පයක් ඉදි කිරීම සඳහා කොන්ත්‍රාත්කාරු වෙත ගෙවා තිබුණු රු.7,326,743 ක මුදලක් වැඩ නිමකර ඇති බවට තහවුරු කර ගැනීමකින් තොරව ප්‍රාග්ධනිත කර තිබිණි.

(උ) සමාලෝචිත වර්ෂය තුල මුදල් කරන ලද රු.43,000,000ක ස්ථාවර තැන්පතු වලට අදාලව ලැබී තිබුණු පොලිය රු. 321,584ක් මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ වාර්ෂික වත්කම් ක්ෂය ලෙස ආදායම් ප්‍රකාශනයට ඇතුලත් කර තිබුණු රු. 217,859,998 ක් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

i. 2008 වර්ෂයේ මිලදී ගත් රු.1,279,860 ක් වටිනා මෝටර් රථ වෙනුවෙන් 2009 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති නමුත්, සමාලෝචිත වර්ෂය සඳහා රු.194,209 ක් ක්ෂය කිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් වර්ෂයේ අතිරික්තය හා ජංගම නොවන වත්කම් අඩුවෙන් දක්වා තිබුණි.

ii. විශ්වවිද්‍යාලයේ ක්ෂය ප්‍රතිපත්තියට අනුව වත්කම් මිලදීගත් දිනය පදනම් කරගෙන ක්ෂය ගණනය කළ යුතු නමුත් 2009 වසර තුල මිලදී ගත් වත්කම 17 ක් සඳහා සමාලෝචිත වර්ෂයට අදාල ප්‍රමාණය වෙනුවෙන් ක්ෂය ගණනය නොකිරීම නිසා වාර්ෂික ක්ෂය වියදම රු.9,411,811 කින් අඩුවෙන් දැක්වීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය හා ජංගම නොවන වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

2.3 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

2008 අප්‍රේල් 24 දිනැති අංක 431 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාර විදේශ ගමන් වලදී යානපත්‍ර මිලදී ගැනීමේ සහ ගුවන් ගමන් සංවිධානය කිරීමේ කටයුතු රාජ්‍ය බැංකු යටතේ පාලිත සමාගම් වන බී.ඕ.සී ට්‍රැවල්ස් හා පීපල්ස් ට්‍රැවල්ස් යන සමාගම් මඟින් ඉටුකර ගතයුතු බව දක්වා තිබුණද, බැංගලෝරයේ විදේශ සම්මන්ත්‍රණයකට සහභාගි වූ නිලධාරීන් දෙදෙනෙකු සඳහා රු.63,000 ක් වන යාන පත්‍ර චක්‍රලේඛයෙහි සඳහන් නොවූ ආයතනයක් මඟින් මිලදී ගෙන තිබුණි.

2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 ජනවාරි 01 දිනැති අංක BD/CBP/4/1/14/2014 දරන අයවැය චක්‍රලේඛ අංක 1/14 හි 2.1.5 ඡේදය ප්‍රකාරව ආයතනයේ සේවකයන් සම්බන්ධයෙන් කෙරෙන සියළු ගෙවීම් භාණ්ඩාගාර අනුමැතිය ඇතිව නිකුත් කෙරෙන චක්‍රලේඛයන්ට අනුකූල විය යුතු අතර එවැනි චක්‍රලේඛයන්ගෙන් ආවරණය නොවන ගෙවීම් කිරීමට පෙර අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය සහිතව භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිව පමණක් එවැනි ගෙවීම් කළ යුතුය. එහෙත් ඊට පටහැනිව වෛද්‍ය පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා මහාචාර්ය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය හා ආධුනික කථිකාචාර්යවරුන් සඳහා පිළිවෙලින් රු.100,000, රු.80,000 ක් සහ රු. 50,000 ක් රඳවා ගැනීමේ දීමනා ලෙස මාසිකව ගෙවා තිබූ අතර සමාලෝචිත වර්ෂය තුල එසේ ගෙවා තිබූ දීමනා වල එකතුව රු.4,782,500 ක් විය.

(ආ) 2014 ජුලි17 දිනැති අංක 07 /2014 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාරව 2011/2012 අධ්‍යයන වර්ෂය පාදක කොටගෙන සියයට 10 ක අතිරේක ශිෂ්‍ය සංඛ්‍යාවක් බඳවා ගැනීමට කටයුතු කළ යුතු බවද, ඒ සඳහා පවතින ශිෂ්‍ය ඉල්ලුම අඩු වන්නේ නම් ඉල්ලුම වැඩිකර ගැනීම සඳහා අවශ්‍ය නව්‍යකරණ වැඩ පිළිවෙලක් සැකසීමට ක්‍රියාමාර්ග ගත යුතු බවද ඒ සඳහා දිරි ගැන්වීමක් ලෙස අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා මූලික වැටුපෙන් සියයට 20 ක අතිරේක දීමනාවක් ගෙවිය හැකි බවද, පෙන්වා දී තිබුණි.එහෙත් විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨය හැර අනෙකුත් පීඨවල අතිරේක ශිෂ්‍ය බඳවා ගැනීම අපේක්ෂිත ආකාරයට සිදුවී නොතිබුණු අතර 2011/2012 අධ්‍යයන වර්ෂයට සාපේක්ෂව 2013/2014 අධ්‍යයන වර්ෂයේ ශිෂ්‍යයන් බඳවා ගැනීම අපේක්ෂිත ඉලක්කයට ළඟාවී නොතිබියදී විශ්වවිද්‍යාලයේ සමස්ථ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා මෙම දීමනාව ගෙවා තිබුණි.

4.3 ප්‍රමාද වූ ව්‍යාපෘති

------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කෘෂිකර්ම පීඨය පුළුල් කිරීමේ කටයුතු සඳහා අක්කර 15 ක පමණ ඉඩමක් අත්පත් කරගැනීම වෙනුවෙන් 2011 වර්ෂයේදී ප්‍රාදේශීය ලේකම් වෙත රු. 7,200,000 ක මුදලක් තැන්පත් කර ඇතත්, අදාල පවරා ගැනීම සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා සම්පූර්ණ කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල නිමකළ යුතු කෘෂිකර්ම පීඨයේ කාන්තා නේවාසිකාගාරය ඉදි කිරීම හා ව්‍යවහාර විද්‍යා පීඨයේ විද්‍යාගාරය ඉදි කිරීම් ව්‍යාපෘති විගණිත දිනය වූ 2015 මාර්තු 31 දින වන විට ඉදි කිරීම් මාස 03 සිට මාස 08 දක්වා කාලයක් ප්‍රමාද වී තිබූ බව නිරීක්ෂණය විය.

4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

-----------------------------------

(අ) සමාලෝචිත වර්ෂයේදී අධ්‍යයන කාර්යය මණ්ඩලයේ තනතුරු 118ක හා අනධ්‍යන කාර්ය මණ්ඩලයේ තනතුරු 81ක පුරප්පාඩු පැවතුණි.

(ආ) අධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු අතරින් වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨයේ මහාචාර්ය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය හා ආධුනික කථිකාචාර්ය පුරප්පාඩු 48 ක් පැවති අතර එම පුරප්පාඩු වෙනුවෙන් බාහිර කථිකාචාර්යවරුන් 36 දෙනෙකු සේවයේ යොදවාගෙන එම කාර්යයන් ඉටුකරවාගෙන තිබුණි.

4.5 කොන්ත්‍රාත් පරිපාලනයේ දුර්වලතා

--------------------------------------

(අ) විශ්වවිද්‍යාලයේ අවශ්‍යතා සඳහා සමාලෝචිත වර්ෂය තුල රු.2,583,585 ක තිරරෙදි සපයා සවිකිරීමේදී පහත සඳහන් කොන්ත්‍රාත් පරිපාලන දුර්වලතා නිරීක්ෂණය විය.

(i) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.5.1 මාර්ගෝපදේශය ප්‍රකාරව සෘජු කොන්ත්‍රාත් පිරිනැමියහැකි අවස්ථාවන්ගෙන් පරිබාහිරව සුදුසුකම් ලත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට සහභාගි වීමට අවස්ථාව නොදී ලක් සළු සල ආයතනයෙන් සෘජු කොන්ත්‍රාත් ක්‍රමයට මෙම මිලදී ගැනීම් සිදුකර තිබුණි.

(ආ) 2013 මැයි 08 දිනැති අංක HE/D/2013/32 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව තරඟකාරී ලංසු කැඳවීමකින් තොරව Turn Key Basis ක්‍රමයට ඉදිකිරීම සඳහා ව්‍යවහාරික විද්‍යා පීඨයේ විද්‍යාගාරය හා දේශන ශාලා ඉදිකිරීමේ ව්‍යාපෘතිය නිම කිරීමට අපේක්ෂිත දින සිට 2015 අගෝස්තු 30 දිනට මාස 08ක ප්‍රමාදයක් සිදුවී තිබුණි.කොන්ත්‍රාත්කරුගේ ප්‍රමාදයන් නිසා මෙම ව්‍යාපෘතිය ප්‍රමාදවී තිබූ නමුත් විශ්වවිද්‍යාලය විසින් සමාලෝචිත වර්ෂය තුල මිල විචලනය ලෙස රු.96,914ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබූ අතර අය නොවූ වැඩ ආරම්භ කිරීම් අත්තිකාරම් රු.6,437,562 ක් විය.

(ඇ) විශ්වවිද්‍යාලයේ කාර්යාලීය අවශ්‍යතා සහ අධ්‍යයන කාර්ය මණ්ඩල අවශ්‍යතා සඳහා භාවිතා කිරීම සඳහා ප්‍රමාණවත් වාහන සංචිතයක් පැවතියදී එම කාර්යයන් සඳහා කුලී පදනම මත වාහන 08ක් සේවයේ යොදවාගෙන සමාලෝචිත වර්ෂය තුල රු.6,265,784 ක කුලී රථ ගාස්තු ගෙවා තිබුණි.

(ඈ) විශ්වවිද්‍යාලයේ උද්‍යාන නඩත්තු සේවා සැපයීම් කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා සකස්කළ ප්‍රසම්පාදන ලියකියවිලි වල තරඟකාරිත්වය අධෛර්යමත් කරවන කොන්දේසි ඇතුලත් කිරීම හේතුවෙන් 2008 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා පැවති සියළු ලංසු වලදී අපේක්ෂා කරන ලද සුදුසුකම්, කිසිදු ලංසුකරුවෙකු සපුරා නොතිබියදී එකම ආයතනයකට ලංසුව පිරිනමා තිබූ අතර එම ආයතනය 2008 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ලංසුවේ වටිනාකම වාර්ෂිකව රු. 4,302,365 සිට රු. 24,068,615 දක්වා ඉහල දමමින් ලංසුව ලබාගැනීම හේතුවෙන් විශ්වවිද්‍යාල උද්‍යාන නඩත්තු සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුවී තිබූ අතර සමාලෝචිත වර්ෂයට අදාල එම වියදම රු. මිලියන 24 ක්ද ඉක්මවා තිබුණි.

4.7 හඳුනා ගන්නා ලද පාඩු

----------------------------

සමාලෝචිත වර්ෂය තුළ සිදුකර තිබූ පුස්තකාල පොත් සමීක්ෂණ වාර්තාව අනුව වටිනාකම හඳුනාගත නොහැකි පොත් 3,807 ක ඌනතාවයක් වූ අතර පොත් 4,152 ක් භාවිතයට නොගෙන ගොඩගසා තිබුණි.

5. පද්ධති හා පාලනයන්

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර උපකුලපති වෙත යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

(අ) ස්ථාවර වත්කම් පාලනය

(ආ) කොන්ත්‍රාත් පාලනය

(ඇ) අයවැය පාලනය

(ඈ) මානව සම්පත් කළමනාකරණය

(ඉ) වාහන පාලනය

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති (වැඩබලන)

**ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ 2014/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (2) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාවේ දැක්වෙන කරුණු සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ අදහස් දැක්වීම සහ එකඟවිය නොහැකි කරුණු සම්බන්ධයෙන් පැහැදිලි කිරීම**

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 106 (2) සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ 107 (13) 7 ඒ වගන්ති ප්‍රකාර රජරට විශ්වවිද්‍යාලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වාර්ෂික ගිණුම් වාර්තා 2015 මාර්තු 31 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. එම වාර්ෂික ගිණුම් වාර්තාව සම්බන්ධයෙන් වූ විගණකාධිපති වාර්තාව 2015 සැප්තැම්බර් 25 දින විශ්වවිද්‍යාලය වෙත ලැබී ඇති අතර ඒ සම්බන්ධයෙන් අදහස් දැක්වීම හා එකඟ විය නොහැකි කරුණු සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් එකී විගණන වාර්තාවේ අංක පිළිවෙල අනුව පහතින් ඉදිරිපත් කරණු ලැබේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත

විගණන වාර්තාවේ සඳහන් කරුණු සමඟ එකඟ වේ.
ණය මුදල් වෙනුවෙන් ගෙවන පොලී වියදම් "මූල්‍ය පිරිවැය" වශයෙන් ඉදිරි වර්ෂ වලදී මූල්‍ය ප්‍රකාශන තුළ දැක්වීමට කටයුතු කරණු ලැබේ.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

අ විගණන වාර්තාවේ සඳහන් කරුණු සමඟ එකඟ වේ.
ජර්නල් අංක 202 මඟින් නිවැරදි කර ඇත. තවද, විගණන වාර්තාවේ සඳහන් මුදල රු. 350,966.25 ක් ලෙස නිවැරදි විය යුතු ය.

ආ විගණන වාර්තාවේ සඳහන් කරුණු සමඟ එකඟ නොවේ.
මෙම නේවාසිකාගාර ඉදිකිරීම් සම්බන්ධ ව්‍යාපෘතිය උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මෙහෙයවන ලද අතර ICC ආයතනය විසින් අදාල ඉදි කිරීම් සිදු කර ඇත. 2014.12.31 වන විට ඉදිකිරීම් අවසන්ව පැවතියද එම ඉදිකිරීම් ආයතනය විසින් අදාළ තක්සේරු වාර්තා එදිනට විශ්වවිද්‍යාලය වෙත ලබා නොදී තිබීම හේතුවෙන් එම වටිනාකම් මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කර නොමැත.
එසේම, එම නේවාසිකාගාර සඳහා ගෘහ භාණ්ඩ මිලදී ගැනීම් කටයුතු 2014.12.31 දින වන විට සිදු වෙමින් පැවති බැවින් අදාළ වියදම් රු. 8,532,942.00 ක් ප්‍රාග්ධනිත කර නොමැත.

ඇ විගණන වාර්තාවේ සඳහන් කරුණු සමඟ එකඟ වේ.
ජර්නල් අංක 203 සහ 205 මඟින් නිවැරදි කර ඇත.

ඈ විගණන වාර්තාවේ සඳහන් කරුණු සමඟ එකඟ වේ.
ජර්නල් අංක 204 මඟින් නිවැරදි කර ඇත.

ඉ විගණන වාර්තාවේ සඳහන් කරුණු සංශෝධනයන්ට යටත්ව පිළිගනු ලැබේ.
ජර්නල් අංක 206 සහ 207 මඟින් නිවැරදි කර ඇත.

ඊ විගණන වාර්තාවේ සඳහන් කරුණු සමඟ එකඟ වේ.
ජර්නල් අංක 208 මඟින් නිවැරදි කර ඇත.

උ විගණන වාර්තාවේ සඳහන් කරුණු සමග එකඟ නොවේ.
අදාළ පොලී මුදල් නිවරදි ලෙස ගිණුම්ගත කර ඇත.

ඌ (i) විගණන වාර්තාවේ සඳහන් කරුණු සමග එකඟ වේ.
ජර්නල් අංක 210 මගින් නිවරැදි කර ඇත.

(ii) විගණන වාර්තාවේ සඳහන් කරුණු සමග එකඟ නොවේ.
2010 වර්ෂය තුළදී අදාළ වත්කම්වල අගය නැවත තක්සේරු කර ඇති අතර එම තක්සේරු වටිනාකම් මත පදනම්ව ක්ෂය කිරීම් සිදුකර ඇත.

එ විගණන වාර්තාවේ සඳහන් කරුණු සමග එකඟ වේ.
ජර්නල් අංක 213 මගින් නිවරැදි කර ඇත.

ඒ විගණන වාර්තාවේ සඳහන් කරුණු සමග එකඟ වේ. ඉදිරියේදී එවැනි මගහැරීම් නිවරැදි කිරීමට පියවර ගනු ලැබේ.

### 2.2.3 නොසැසඳුනු පාලන ගිණුම්

විගණන වාර්තාවේ සඳහන් කරුණු සමග එකඟ වේ. ජර්නල් අංක 202 (214) මගින් නිවරැදි වී ඇති අතර එම නිවරැදි අගය ඇතුළත් වීමෙන් පසු උප ලේඛනයේ අගය සමග අදාල ගිණුම් ශේෂය සමාන වේ.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

අ විගණන වාර්තාවේ දක්වා ඇති කරුණු පිළිගනු නොලැබේ.

අදාල ධාවන සටහන් වලින් කොටසක් පමණක් විගණිත දිනයේදී විගණනයට ඉදිරිපත් වී ඇතත්, මිහින්තලේ පරිශ්‍රයෙන් බැහැරව පිහිටි වෛද්‍ය හා සමාන්තර පීඨයට සහ කෘෂි කර්ම පීඨයට අයත් ධාවන සටහන් පොත් එදිනට විගණනයට ඉදිරිපත් වී නොමැත. එසේ විගණනයට ඉදිරිපත් නොවූ ධාවන සටහන් අදාල පීඨයන් වෙතින් ලබා ගැනීමට සහ නිරීක්ෂණය කිරීමට හැකි වේ.

ආ විගණන වාර්තාවේ දක්වා ඇති කරුණු පිළිගනු ලැබේ. එසේ වුවද, විශ්වවිද්‍යාලය සතු සියළුම වාහන විශ්වවිද්‍යාල පරිශ්‍රයෙන් බැහැරට යන විට ඒ සඳහා අදාල නිලධාරියාගේ අනුමැතිය සහිත ගේට්ටු අවසර පත්‍රයක් පවතින බැවින් විගණන වාර්තාවේ සඳහන් ගමන් වාර සම්බන්ධයෙන් අවශ්‍ය සියළු තහවුරු කිරීම් එම ගේට්ටු අවසර පත පරීක්ෂා කිරීමෙන් ලබා ගත හැක.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණන වාර්තාවේ දක්වා ඇති කරුණු පිළිගනු නොලැබේ. චක්‍රලේඛ ප්‍රකාරව අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියට යටත්ව ගෙවීම් කර ඇත.

2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

අ විගණන වාර්තාවේ දක්වා ඇති කරුණු පිළිගනු ලැබේ.

එසේ වුවද, රජරට විශ්වවිද්‍යාලයට අයත් සාලියපුර වෛද්‍ය පීඨය නාගරික ප්‍රදේශවලින් බැහැරව පිහිටා තිබීමත් සහ සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ රජයේ රෝහල් වල සේවයේ යෙදෙන වෛද්‍යවරුන් සඳහා සාපේක්ෂව ඉහළ ප්‍රතිලාභ හිමිවීමත් හේතුවෙන් වෛද්‍යවරුන් පීඨයේ ස්ථිර අධ්‍යයන කාර්යය මණ්ඩලයට බඳවා ගැනීමට මෙන්ම රඳවා ගැනීමටද නොහැකිවීමේ තත්වයක් තුළ පීඨයේ අධ්‍යයන කටයුතු අඛණ්ඩව පවත්වා ගැනීමට නොහැකි තත්වයක් උද්ගත වී ඇත.

ඊට පිළියම් ලෙස, රජරට විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට අයත් එම්.බී.බී.එස්. වෛද්‍යවරුන් සඳහා ඔවුන්ගේ තනතුරු පදනම්කර ගනිමින් කිසියම් රඳවා ගැනීමේ දීමනාවක් ගෙවීම සම්බන්ධයෙන් සලකා බැලීම සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ නිළධාරීන්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිළධාරීන් සහ රජරට විශ්වවිද්‍යාලයේ නිළධාරීන් විසින් සාකච්ඡා වට කිහිපයක් පවත්වා ඇත. ඒ අනුව, 2014.8.13 දින උසස් අධ්‍යාපන ගරු අමාත්‍යවරයා සමඟ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිළධාරීන් සහ උපකුලපති සහ වෛද්‍ය පීඨයේ පීඨාධිපති ඇතුළු ව අදාළ නිළධාරීන් එක්ව සිදු කළ සාකච්ඡාවේදී, විශ්වවිද්‍යාලීය පාලක සභාවේ අනුමැතිය ඇතිව වෛද්‍ය පීඨයේ එම්.බී.බී.එස්. වෛද්‍යවරුන් සඳහා ඔවුන්ගේ තනතුරු පදනම් කර ගනිමින් කිසියම් රඳවා ගැනීමේ දීමනාවක් ගෙවීම සුදුසු බවට යෝජනා වී ඇත. ඉන් අනතුරුව, රජරට විශ්වවිද්‍යාලයේ 101 වැනි මුදල් කමිටු නිර්දේශය සහ 186 වැනි පාලක සභා අනුමැතිය ඇතිව එකී වෛද්‍යවරුන් සඳහා 2014.09.01 දින සිට මාසික රඳවා ගැනීමේ දීමනාවක් ගෙවනු ලැබේ.මේ සඳහා දැනට පුරප්පාඩුවී පවතින තනතුරු වල වැටුප් ප්‍රතිපාදනයන් යොදා ගනු ලැබේ.

ආ විගණන වාර්තාවේ දක්වා ඇති කරුණු සමග එකඟ නොවේ.

2014/7 විශ්වවිද්‍යාල කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාරව 2014.7.1 දින සිට සියළුම අධ්‍යයන සහ අනධ්‍යයන කාර්යය මණ්ඩල සඳහා මූලික වැටුපෙන් 20% සමාන දීමනාවක් ගෙවන අතර මෙය සමස්ථ විශ්වවිද්‍යාල පද්ධතිය තුළම ක්‍රියාත්මක වේ.

3 මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිපල

විගණන වාර්තාවේ මූල්‍ය සමාලෝචනය යටතේ දක්වා ඇති කරුණු සමඟ එකඟ වේ.

4 මෙහෙයුම් සමාලෝචනය

4.1 ඒක ශිෂ්‍ය පිරිවැය

විගණන වාර්තාවේ දක්වා ඇති තොරතුරු පිළිගනු ලැබේ.

ශිෂ්‍ය බඳවා ගැනීම් සම්බන්ධයෙන් කටයුතු සිදු කරනුයේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් වන බැවින් කෘෂිකර්ම පීඨය සඳහා වැඩි ශිෂ්‍ය සංඛ්‍යාවක් බඳවා ගැනීමට කටයුතු කරන මෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව දැණුවත් කර ඇත.

4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පොලිස් නිවාස පවරා ගැනීමේ කටයුතු අවසන් අධියරේ පවතී. මේ සම්බන්ධ එකඟතාවය පොලිස් දෙපාර්තමේනතුව විසින් මෙතෙක් ලබා දී නොමැති නිසා ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව සමඟ තවදුරටත් සාකච්ඡා පවත්වමින් ඇත. තවද, පොලිස් නිවාස පවරා ගනු ලබන්නේ ශිෂ්‍ය නේවාසිකාගාර ඉදිකිරීම් සඳහා නොවන අතර කාර්යය මණ්ඩල නිළ නිවාස ඉදිකිරීම් සඳහා වේ.

4.3 ප්‍රමාද වූ ව්‍යාපෘති

අ විගණන විමසුමේ සඳහන් කරුණු පිළිගනු ලැබේ.

අදාළ ඉඩම විශ්වවිද්‍යාලය වෙත අත්පත් කර ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් වෙත මූලික කිසියම් ගාස්තුවක් ගෙවිය යුතු අතර පවරා ගැනීමේ ක්‍රියාවලියේ එක් අධියරකදී අදාල ඉඩම රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු කර වටිනාකම තීරණය කළ පසු ඉතිරි මුදල ගෙවිය යුතුවේ. ඒ අනුව, මෙම පවරා ගැනීමට යෝජිත ඉඩම සඳහා තක්සේරු වටිනාකම තීරණය කරන තුරු මෙසේ ප්‍රාදේශීය ලේකම් වෙත මුදල් තැන්පත් කර ඇත.රජයට අයත් ඉඩම් පවරා ගැනීමේ කාර්යය සංකීර්ණ කාර්යයක් වන අතර ඒ සඳහා දීර්ඝ කාලයක් ද ගත කිරීමට සිදුවේ.

ආ විගණන විමසුමේ සඳහන් කරුණු පිළිගනු ලැබේ.

අදාළ ඉදිකිරීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සහ ඉංජිනේරු කාර්යයන් පිළිබඳ උපදේශන සපයන ආයතනය වන CECB මගින් උපදේශන සේවා සපයන අතර ඉදිකිරීම් සඳහා කල් දිගු ලබා දීම එම ආයතන මගින් අනුමත කර ඇත.

4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

අ පුරප්පාඩු තනතුරු සංඛ්‍යා සංශෝධනයට යටත්ව විගණන විමසුමේ දක්වා ඇති කරුණු පිළිගනු ලැබේ. ඒ අනුව, පුරප්පාඩු පිරවීම සඳහා කළමණාකරණය විසින් කටයුතු කරනු ලැබේ.

ආ විගණන විමසුමේ දක්වා ඇති කරුණු සමඟ එකඟ වන අතර වෛද්‍ය පීඨයේ ස්ථිර අධ්‍යයන කාර්යය මණ්ඩලයේ පවතින පුරප්පාඩු වෙනුවෙන් බඳවා ගැනීම් සිදු කරන තුරු එම වැටුප් ප්‍රතිපාදන භාවිත කරමින් ආධුනික කතිකාචාර්යවරුන්ගේ සේවය ලබා ගෙන පීඨයේ අධ්‍යයන කටයුතු සිදු කර ඇත.

4.5 කොන්ත්‍රාත් පරිපාලනයේ දුර්වලතා

(i) රෙදි පිලි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන මිලදී ගැනීමේදී ලක් සළු සල පළමු තෝරා ගැනීම ලෙස සලකා කටයුතු කළ යුතුය යන කොන්දේසිය ඇතුළත් කැබිනට් පත්‍රිකා පිටපතක් හා එම කැබිනට් තීරණයට අනුව කටයුතු කරන ලෙස දන්වා 2013.07.30 දාතමින් උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ අධ්‍යක්ෂ ( ප්‍රසම්පාදන) විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන සභාවේ සභාපති වෙත එවන ලදුව උපකුළපති වෙත පිටපත් කරන ලද

ලිපිය අනුව කටයුතු කර ඇත. එබැවින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.5.1 ප්‍රකාරව සුදුසුකම් ලත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ප්‍රසම්පාදනයට සහභාගී වීමට අවස්ථාවක් නොදී විශ්වවිද්‍යාලය විසින් මිලදී ගැනීම් සිදු කර ඇතැයි යන්නට එකඟවිය නොහැක.

(ii) මෙම මිලදී ගැනීම සිදු කර ඇත්තේ ඉහත අංක (i) යටතේ විස්තර කළ කැබිනට් තීරණය මත පදනම්ව මිස ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 පරිදි සෘජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ නොවන අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ දක්වා ඇති රු. 250,000.00 උපරිම සීමාව අදාළ කර ගෙන නැත.

(iii) ලක් සළු සල රාජ්‍ය ආයතනයක් වන අතර මෙම කොන්ත්‍රාත්තුවේ වටිනාකම රු. මි. 2.5 ක් වේ.ලක් සළු සල ප්‍රතිව්‍යුහගත කරන වැඩපිළිවෙලක් රජය විසින් ක්‍රියාත්මක කරවන අවස්ථාවක මෙම කොන්ත්‍රාත්තුව විශ්වවිද්‍යාලය විසින් එම ආයතනය වෙත ලබා දී ඇත.මූල්‍ය පහසුකම් සපයා ගැනීමේ දුෂ්කරතාවය හේතුවෙන් 20% අත්තිකාරම් මුදලක් වෙනුවට 50% අත්තිකාරම් මුදලක් ඔවුන් විසින් ඉල්ලා සිටි බැවින් 2013.10.21 වැනි දින එම අත්තිකාරම් මුදල් ලබා දී ඇති අතර ඊට දින 10 කට පසු එනම් 2014.11.03 දින වැඩ සම්පූර්ණයෙන් නිම කර භාර දී ඇත. ඒ අනුව 2014.11.11 දින අවසන් බිල්පත් ගෙවීමත් සමඟ එම අත්තිකාරම් ආපසු අය කර ගෙන ඇත.

(iv) මෙය රජයට අයත් ආයතනක් වෙත පවරා දුන් කොන්ත්‍රාත්තුවක් වන බැවින් කොන්ත්‍රාත් ප්‍රදානයේදී යොදා ගන්නා පොදු කොන්දේසි සියල්ලක්ම අදාළ කර ගෙන නොමැත. සම්මත ලංසු ආකෘති පත්‍ර යොදාගෙන නොමැති අතර රඳවා ගැනීම් පිළිබඳ කොන්දේසියක්ද ඇතුළත් වී නොමැත.
බිල්පත් ගෙවීමේදී 10% මුදලක් රඳවා ගැනීමක් සිදු නොකරන ලෙසටත් ඇණවුමෙහි යම්කිසි අළුත්වැඩියාවක් කිරීමට සිදුවුවහොත් එය ලක් සළු සල ආයතනය මඟින් සිදුකරන බවටත් එකඟ වෙමින් ඒ බව විශ්වවිද්‍යාලය වෙත ලිඛිතව දන්වා එවා ඇති අතර ඒ අනුව ගෙවීම් සිදු කර ඇත.

(v) විගණන වාර්තාවේ සඳහන් කරුණු පිළිගනු නොලැබේ. අදාළ කොන්ත්‍රාත්තුව පිරිනැමීමේදී කොන්ත්‍රාත් වටිනාකමින් 5% ක ඇප සුරක්ෂණයක් ලබා ගෙන ඇත. "සී/ස කෝපරේට්ව් ඉන්ෂුවරන්ස්" ආයතනය මඟින් ලබා දී ඇති එකී ඇප සුරකුම් සහතිකයේ පිටපතක්ද විගණනයට ඉදිරිපත් කර ඇත.

## 4.6 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) විගණන වාර්ථාවේ සඳහන් කරුණු පිළිගනු ලැබේ.

මෙම ඉදිකිරීම් හැකිතාක් දුරට කඩිනම් කරවීමටත්, කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් උපදේශන ආයතනය වශයෙන් කටයුතු කරන ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මඟින් කොන්ත්‍රාත් කල් දිගු කිරීම් අනුමත නොකරන කාලය සඳහා අදාල ප්‍රමාද ගාස්තු කොන්ත්‍රාත්කරුගෙන් අය කර ගැනීමටත් කටයුතු කරනු ලැබේ. තවද, වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වශයෙන් කොන්ත්‍රාත් වටිනාකමින් 20% ක මුදලක් ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත්කරුට ගෙවා ඇති අතර බිල්පත් ඉදිරිපත් කිරීමේ දී කොටස් වශයෙන් අඩු කර ගනු ලැබේ. කොන්ත්‍රාත් මිලෙන් 90% ක් දක්වා ගෙවීම් කිරීමට පෙර ගෙන ලද මුළු අත්තිකාරම් මුදල ආපසු අය කර ගත යුතු වීම ගිවිසුමේ ඇතුළත් කොන්දේසිය වේ.

(ආ) විගණන වාර්ථාවේ සඳහන් පරිදි ඉදිකිරීමේ ප්‍රමාදයක් සිදු වී ඇති බවට පිළිගනු ලැබේ.
මෙම ව්‍යාපෘතියේ ඉදි කිරීම් සඳහා උපදේශන සේවා සපයනු ලබන්නේ CECB ආයතනය වන අතර ඔවුන් විසින් අනුමත කල් දිගුව ට පෙර සිදු වන මිල විචලනයන් සඳහා අදාල ගාස්තු ගෙවීමට විශ්වවිද්‍යාලය ගිවිසුම් ප්‍රකාරව බැඳී සිටී (ICTAD/SBD/04 හි ඇතුළත් කොන්දේසි 13.7 ප්‍රකාරව). ඒ

අනුව ප්‍රමාද කාලයට පෙර සිදුවන ලද මිල විචලනයන් ගෙවීම් කර ඇත. තවද මෙම කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන්ද අත්තිකාරම් මුදල් ආපසු අය කිරීම සිදු කරනුයේ ඉහත "අ" කොටසින් පැහැදිලි කළ පරිදිය.

(ඇ) විශ්වවිද්‍යාලය සතු වාහන වලින් 58-1353 සහ 253-4339 දරණ කැබ් රථ 2 කෙටි දුර ධාවනයට පමණක් සුදුසු තත්වයේ පවතින අතර KF - 7601, KJ – 0182, KJ – 0241, KJ 0245, KJ – 0315 යන මෝටරථ 5 පීඨාධිපතිවරුන්ගේ රාජකාරිමය අවශ්‍යතා සඳහා වෙන් කර ඇත. ඒ අනුව, සංචිතයේ ඉතිරිව පවතින PE – 2108 හා PE – 2109 යන කැබ් රථ 2 සහ PB – 7640 වෑන් රථය කාර්යාලයීය සහ අධ්‍යයන කාර්යය මණ්ඩලයේ අවශ්‍යතා සඳහා යොදවා ගැනීමට ප්‍රමාණවත නොවන බැවින් කුලී පදනමින් වාහන ලබා ගෙන ඇත. කෙසේ වුවද, විගණන වාර්ථාවේ කුලී පදනමින් වාහන 8 ක් ලබා ගෙන තිබෙන බවට සඳහන් කිරීම සම්බන්ධයෙන් එකඟ නොවන අතර එක් එක් වාහනයේ කුලී කාලය අවසන් වීමත් සමඟ වවිධ අවස්ථා 8 කදී මෙම වාහන කුලියට ලබා ගෙන ඇත.

(ඈ) විගණන වාර්තාවේ කරුණු පිළිගනු ලැබේ.

වඩාත් කාර්යකෂම සේවාවක් ලබා ගැනීමේ අරමුණින් ප්‍රසම්පාදන ලියකියවිලි තුළ කොන්දේසි ඇතුළත් කර ඇත. වාර්ෂිකව විශ්වවිද්‍යාලය සතු උද්‍යාන භූමි ප්‍රමාණය ඉහළ යෑමද වාර්ෂික කොන්ත්‍රාත් මිල ගණන් ඉහළ යාමට හේතුවක් වී ඇත. එසේ වුවද, මෙම තත්වයට පිළියමක් වශයෙන් අවශ්‍ය උපකරණ විශ්වවිද්‍යාලය මඟින් මිලදී ගෙන, ශ්‍රම සැපයුම් කොන්ත්‍රාත්කරුවන් මඟින් ශ්‍රමය ලබා ගෙන උද්‍යාන පිරිසිදු කිරීම් හා නඩත්තු කිරීම් කටයුතු ඉදිරියේදී සිදු කිරීමට පියවර ගෙන ඇත.

## 4.7 හඳුනා ගන්නා ලද පාඩු

විගණන විමසුමේ සඳහන් කරුණු සමඟ එකඟ නොවේ. එහි සඳහන් වනුයේ පුස්තකාල පොත් සමීක්ෂණයේ මූලික නිරීක්ෂණ වාර්තාවේ ඇතුළත් තොරතුරුවන අතර එම නිරීක්ෂණ සම්බන්ධයෙන් පුස්තකලයාධිකාරීගේ කරුණු පැහැදිලි කිරීම් වලට පසු මෙම සංඛ්‍යා වෙනස් වී ඇත. ඒ අනුව පුස්ථකාල පොත් සමීක්ෂණය සිදු කර ඇත්තේ වර්ෂ 5 කින් පමණ වන අතර පුස්ථකාලයක පොත් වර්ෂ 5 ක් තුළදී ක්ෂය වීමට හැකි සාධාරණ අගයකින් පමණක් ඌනතාවයක් පවතින බවට අදාළ සමීක්ෂණ වාර්ථාවෙන් පෙන්වා දී ඇත.

## 5 පද්ධති හා පාලනයන්

විගණන වාර්ථාවේ පෙන්වා ඇති ස්ථාවර වත්කම් පාලනය, කොන්ත්‍රාත් පාලනය, අයවැය පාලනය, මානව සම්පත් කළමනාකරණය සහ වාහන පාලනය පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින් කටයුතු කරනු ලැබේ.

මහාචාර්ය කේ.එච්.ආර්.විජයවර්ධන
උප කුලපති
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

මහාචාර්ය රංජිත් විජයවර්ධන
උපකුලපති
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලේ

# ඇමුණුම - E

## විගණකාධිපති වාර්තාව සම්බන්ධව විශ්ව විද්‍යාලයේ නිරීක්ෂණ හා ක්‍රියාමාර්ග

## 2014 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ වාර්ෂික ගිණුම් ප්‍රකාශය පිළිබඳ වූ ව්‍යවස්ථාපිත වාර්තාව

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 106(1), (2) හා 107(ආ) වගන්ති හා ඊට පසු සම්පාදනය කරන ලද 1985 අංක 7 දරණ විශ්විද්‍යාල (සංශෝධන) පනත හා 1971 අංක 38 දරණ මුදල් පනතේ නීති රීති ප්‍රකාරව, මෙම ගිණුම් ප්‍රකාශ පිළියෙල කර ඇත.

විශ්වවිද්‍යාල ගිණුම් ඉදිරිපත් කිරීමේදී සාමාන්‍යයෙන් පිලිගත් ගිණුම්කරණ උපකල්පන. මූලධර්ම,ප්‍රමිත සහ ක්‍රමෝපායන් මෙන්ම රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත වලට අනුගතවෙමින්නුත්. ගිණුම්කරණ සංකල්පයන් පවත්වාගනිමින්නුත්, උපකල්පන, පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සමාහරණ සංකල්ප, උපචිත බව, විශ්වාසනීයත්වය යන කරුනු පිළිබඳව අවධානය යොමු කරමින් ගිණුම් ඉදිරිපත් කිරීම හා අර්තකථනය කිරීම සිදුකර ඇත.

2012 වසර සඳහා ගිණුම් ප්‍රකාශයේ විශේෂයෙන් සටහන් කිරීමට සිදුවන වැදගත් සංඛ්‍යා සටහන් පහත දැක්වේ.

I. පහත දක්වා ඇති පරිදි 2014 වසර සඳහා පුනරාවර්ථන වියදම්, ශිෂ්‍යාධාර ගෙවීම්, මහපොල ගෙවීම් සහ ගොඩනැගිලි, උපකරණ, මූලධන වත්කම් පුනරුත්ථාපනය වෙනුවෙන් රජයේ මුළු ප්‍රතිපාදනය රුපියල් මිලියන 1411.387 ක් විය.

| | |
|---|---|
| පුනරාවර්ථන වියදම් සඳහා රජයේ ප්‍රතිපාදන | රු. මි. 894.000 |
| මහපොල ශිෂ්‍යත්ව සඳහා රජයේ ප්‍රතිපාදන(වි.වි.ප්‍ර.කො.ස.) | රු. මි. 3.989 |
| මහපොළ භාරකාර අරමුදලේ ප්‍රතිපාදන | රු. මි. 32.297 |
| ශිෂ්‍යාධාර ගෙවීම් සඳහා රජයේ ප්‍රතිපාදන | රු. මි. 30.901 |
| මූලධන වත්කම් පුනරුත්ථාපන- ප්‍රාග්ධන 101 | රු. මි. 50.000 |
| ඉඩම් හා ගොඩනැගිලි මිලදී ගැනීම- ප්‍රාග්ධන 103 | රු. මි. 350.200 |
| ඉගැන්වීම් හා විද්‍යාගාර උපකරණ, කාර්යාල ගෘහභාණ්ඩ හා උපකරණ, පොත් සහ වාර සඟරා - ප්‍රාග්ධන 102 | රු. මි. 50.000 |
| **එකතුව** | **රු. මි. 1,411,387** |

II. ක්ෂය හා පාරිතෝෂික ප්‍රතිපාදන ඇතුලත්ව 2014 වසරේදී විශ්වවිද්‍යාලයේ වියදමට වඩා ආදායම රුපියල් මිලියන 4.645 ක් විය.

III. අර්ථසාධක අරමුදල් ණය හැර විශ්වවිද්‍යාලයේ සේවකයන්ට හා වෙනත් අයට ගෙවන ලද ණය හා අත්තිකාරම් ප්‍රමාණය මූල්‍ය තත්ව ප්‍රකාශිත දිනට රුපියල් මිලියන 30.267 ක් විය. සේවකයන් වෙත බැංකු ණය හා සේවක අර්ථසාධක අරමුදල් ණය, සුරැකුම් මත ලබාදී ඇත (අර්ථසාධක අරමුදල්). අර්ථසාධක අරමුදලෙන් ලබා දී ඇති ණය විශ්වවිද්‍යාල කොමිෂන් සභාවේ උපදෙස් මත ගිණුම් පොත් වලින් ඉවත් කර ඇති අතර, විශ්ව විද්‍යාලයේ නිර්දේශයන් මත සේවකයින් සඳහා රාජ්‍ය බැංකුවලින් ඔවුන්ගේ දේපළ ඇපයට තබාගෙන වසර 15 ක කාල පරිච්ඡේදයකින් අයකර ගැනිම සඳහා රු.මි. 1.0 සිට රු.මි. 2.0 දක්වා වෙනත් බැංකු ණය(දේපළ ණය) ලබා දී ඇත. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් අදාළ ණය මුදලේ පොළී අනුපාතයෙන් අඩක් ගෙවනු ලබයි.

IV. මිහින්තලේ රජරට විශ්වවිද්‍යාලයේ මුළු ආයෝජන වල වටිනාකම මූල්‍ය තත්වය ප්‍රකාශිත දිනට රු. මි. 106.448 ක් විය.

V. වෙනත් ප්‍රභවයන්ගෙන් ලද ආදායම රු.මි. 18.781 කි.

VI. මූල්‍ය තත්ව ප්‍රකාශනයේ දක්වා ඇති පරිදි රජරට විශ්වවිද්‍යාලයේ ස්ථාවර වත්කම් මුළු වටිනාකම රු. මි. 2714.648 ක් විය.

VII. පැවැත්ම හා හිමිකාරිත්වය තහවුරු කිරීම සඳහා ගබඩා භෞතිකව ප්‍රත්‍යාගණනය කිරීමෙන් අනතුරුව, මූල්‍ය තත්ව ප්‍රකාශනයේ සඳහන් තොග වටිනාකම රු. මිලියන 27.660 ක් වූ අතර තොග අයිතමයන් සඳහා අයිතම් වටිනාකම ඇතුලත් වන ආකාරයෙන් ගිණුම් වාර්තා පවත්වාගෙන යන ලදි.

VIII. විශ්වවිද්‍යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට මුදල් පොතේ ශේෂය රු. මි. 45.421 ක් විය. කෙසේ වුවද, විශ්වවිද්‍යාලයට එකී දින වන විට උපචිත වියදම් හා වගකීම් තිබූ අතර, ගිණුම් වැසීමෙන් අනතුරුව ලද ප්‍රතිපාදන මගින් එම ශේෂයන් පියවා ඇත.

IX. මූල්‍ය තත්ව ප්‍රකාශිත දිනට විශ්වවිද්‍යාලය මගින් පවත්වාගෙන යනු ලැබූ බැංකු ගිණුම් වල අවසාන ශේෂයන් අදාල මුදල් පොත් සමඟ සසඳා ඇති අතර, එම බැංකු ගිණුම් ශේෂයන් තහවුරු කර සෘජුවම විගණකවරුන් වෙත යැවීමට අදාල බැංකු වෙත දන්වා ඇත.

X. 2015 වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ පර්යේෂණ කටයුතු සඳහා ප්‍රතිපාදිත රු.මි.20.0 ක මුදලින් රු.මි. 14.4 ක වියදමක් දරා ඇති අතර එය පහත පරිදි වේ.

| | |
|---|---|
| අධ්‍යයන පර්යේෂණ දීමනා | රු.මි. 6.76 |
| පර්යේෂණ අත්තිකාරම් | <u>රු.මි. 7.65</u> |
| එකතුව | <u>රු.මි.14.41</u> |

මහාචාර්ය කේ.ඒච්.ආර්.විජේවර්ධන — උපකුලපති
මහාචාර්ය රංජිත් විජයවර්ධන
උපකුලපති
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලේ

ඒ.එම්.ජී.බී.අබේසිංහ — ලේඛකාධිකාරි
ලේඛකාධිකාරි
ශ්‍රී ලංකා රජරට වි[illegible]ාලය

එම්.අයි.එෆ්.රහ්මාන් — මූල්‍යාධිකාරි
එම්.අයි.එෆ්. රහ්මාන්
මූල්‍යාධිකාරී
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලේ

## 2014 වසර සඳහා ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ ගිණුම් ප්‍රකාශන සඳහා සටහන්

<u>සාමාන්‍ය සටහන්</u>

(අ) වර්ෂය සඳහා රජයේ ප්‍රතිපාදන ලැබීම්, අභ්‍යන්තර ප්‍රභවයන් තුළින් ආදායම් ජනනය කිරීම හා වියදම් දැරීම උපචිත පදනමින් වාර්තා කර ඇත.

(ආ) තොග ද්‍රව්‍ය සඳහා ගිණුම් වාර්තා පවත්වාගෙන යන අතර මූල්‍ය තත්ව ප්‍රකාශිත දිනට ගබඩා තොග භෞතිකව සත්‍යාපනය කර වර්ථමාන වටිනාකම, පැවැත්ම, හිමිකාරිත්වය නිශ්චය කිරීම සඳහා පෙර පිවිසි, පෙර නිකුත් ක්‍රමය පදනම්කරගෙන ද්‍රව්‍ය තොග වටිනාකර ගණනය කර ඇත.

(ඇ) මේ අනුව, වැඩසටහන්, ව්‍යාපෘති හා දෙපාර්තමේන්තු පදනම් කර ගනිමින් සහ වැය ශීර්ෂ අනුව වියදම් විශ්ලේෂණය කර ගිණුම් ප්‍රකාශයේ පෙන්වා ඇත.

(ඈ) රජරට විශ්වවිද්‍යාලය භාණ්ඩාගාර ප්‍රතිපාදන ප්‍රයෝජනයට ගනිමින් පුනරුත්තාපන වැඩසටහන යටතේ රු. මි. 50.00 ක් වියදම් කර ඇත.

(ඉ) ව්‍යාපෘති වල ස්වභාවය අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා භාණ්ඩාගාරයේ මූලධර්ම හා ක්‍රම අනුගමනය කරමින් පුනරුත්තාපන ව්‍යාපෘති ගිණුම් ගත කිරීම සිදුකර ඇත.

## ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ව ප්‍රකාශය පිළිබඳ ගිණුම් සටහන

(අ) අදාල වර්ෂයේදී විශ්වවිද්‍යාලයේ ගොඩනැගිලි, උපකරණ හා මූලධන වත්කම් පුනරුත්තාපනය සඳහා ලැබුණු මුළු මූලධන ප්‍රතිපාදනය රු. මි. 450.00 ක් විය.

(ආ) මූල්‍ය තත්ව ප්‍රකාශනය සඳහා සවිස්තරාත්මක ලේඛනයක් කේවල ගිණුම් සඳහා වෙන්වෙන්ව සකසා ඇත.

(ඇ) ස්ථාවර වත්කම් ප්‍රතයාගනන අලයන් අනුව පහත සඳහන් අනුපාතයන් යටතේ ක්ෂය කර ඇත.

| | |
|---|---|
| ගොඩනැගිලි | 5% |
| යන්ත්‍රෝපකරණ හා සවි කිරිම | 20 % |
| ගෘහභාණ්ඩ හා සවිකිරීම් | 10% |
| කාර්යාල උපකරණ | 20% |
| සන්නිවේදන උපකරණ | 20% |
| තොරතුරු තාක්ෂණ උපකරණ | 20% |
| විද්‍යාගාර හා ඉගැන්වීමේ උපකරණ | 20% |
| උපාධි ලෝගු හා මල්මාලා | 20% |
| ක්‍රීඩා උපකරණ | 20% |

පුස්තකාල පොත් හා වාර සඟරා, මෝටර් රථ සහ පශු සම්පත් ප්‍රත්‍යාගණනය කර නොමැති අතර ක්‍ෂය කිරීම් පහත සඳහන් අනුපාතයන් අනුව සිදු කර ඇත.

| | |
|---|---|
| පුස්තකාල පොත් සහ වාරසඟරා | 20% |
| මෝටර් රථ | 20% |
| පශුසම්පත් | 20% |

2014 වසර සඳහා ක්ෂය වෙනුවෙන් රු. මි.217.859 ක් වෙන්කර තිබුණි. 2014 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ක්ෂය රු. මි. 802.373 ක් විය. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 649 ප්‍රකාරව, මිලදී ගැනීම් මත ක්ෂය කිරීම් සිදු කරන අතර බැහැර කිරීම් මාසික පදනම මත කරනු ලැබේ. ප්‍රත්‍යාගණන ගිණුම් ගැලපිම ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව සිදුකර ඇත.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19 අනුව, ඇස්තමේන්තුගත ඒකක ණය ක්‍රමය භාවිත කරමින් රු. මිලියන 3.618 ක් 2014 වසර සඳහා ශේෂ පත්‍ර දිනට පාරිතෝෂික ගෙවීම වෙනුවෙන් වෙන්කර තිබුණි. 2014.12.31 දිනට පාරිතෝෂික සඳහා සමුච්චිත ප්‍රතිපාදන

රු. මිලියන 30.093 කි. පාරිතෝෂික වගකීම බාහිරව ප්‍රතිස්ථාපිත හෝ සත්‍ය ඇගයීම් මත නොවේ.

(ඊ) වෛද්‍ය, ව්‍යවහාරික විද්‍යා හා කෘෂිකර්ම පීඨවල 2014.12.31 දිනට භෞතිකව ගණනය කරන ලද රසායනික ද්‍රව්‍යවල වටිනාකම රු. මිලියන 8.73 ක් වේ.

(උ) පාරිතෝෂික සඳහා වෙන් කිරීම්, වියදම්, ණය හිමියන් හා වගකීම් සඳහා වැය කිරීම් වෙනුවෙන් ප්‍රතිපාදන ඇතුලත්ව විශ්ව විද්‍යාලය සඳහා 2014 වසරේදී වියදමට වැඩි ආදායම රු. මිලියන 4.645 ක් විය. වියදමට වැඩි ආදායමේ සාරාංශය පහත පරිදි දැක්වේ.

| | | |
|---|---|---|
| වියදමට වැඩි ආදායම | | රු. මි. 4.645 |
| <u>එකතු කලා</u> | | |
| කාර්යය මණ්ඩල පාරිතෝෂික ගෙවීම් | රු. මි. 3.618 | |
| සම්මුච්චිත වියදම් සඳහා ප්‍රතිපාදන | <u>රු. මි. 27574</u> | |
| මුළු ප්‍රතිපාදන | | <u>රු. මි. 31.192</u> |
| වාර්ෂික හිඟය | | <u>රු. මි. 35.837</u> |

(ඌ) 2014 මුල්‍ය වර්ෂය අවසානයේදී මූලධන වැඩ වෙනුවෙන් රුපියල් මිලියන 487.946 ක මුදලක් වැය කර ඇත. භාණ්ඩාගාරය මගින් අරමුදල් නිදහස් කර ගැනීම සීමා කිරීම නිසා රු. 100.00 ක වටිනාකමැති බිල්පත් නිරවුල් කිරීමට නොහැකි විය. එම රු.මි.100.00 ක මුදල ගිණුම් වාර්තා ඉදිරිපත් කරන දිනට විශ්වවිද්‍යාලය වෙත ලැබී නොතිබිණි.

(ඒ) කොන්ත්‍රාත් ව්‍යාපෘති යටතේ ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවිය යුතු බිල්පත් පියවීම වෙනුවෙන් ලංකා බැංකුව මිහින්තලය ශාඛාවෙන් රුපියල් මිලියන 29 ක ණය මුදලක් විශ්ව විද්‍යාලය විසින් ලබා ගෙන ඇත. රු. මිලියන 30.00 වටිනාකමින් යුත් ස්ථාවර තැන්පතු ඇප සුරැකුම් වශයෙන් තබාගෙන ණය මුදල ලබා දී ඇත. අදාළ ස්වයං මුල්‍ය ව්‍යාපෘති වලින් 2.0% අමතර වාර්ෂික පොලිය අයකර ගැනීමය කටයුතු කර ඇත. භාණ්ඩාගාර අරමුදල් නිදහස් කිරීම් සීමා වීම නිසා මෙම ණය මුදල මේ වන විටත් පියවා නොමැත.

මහාචාර්යය කේ.ඒච්.ආර්.විජේවර්ධන
උපකුලපති
මහාචාර්ය රංජිත් විජයවර්ධන
උපකුලපති
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලේ

ඒ.එම්.ජී.බී.අබේසිංහ
ලේඛකාධිකාරී

එම්.අයි.එෆ්.රහ්මාන්
මූල්‍යාධිකාරී
එම්.අයි.එෆ්. රහ්මාන්
මූල්‍යාධිකාරී
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලේ

## ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලය
## 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය

| විස්තරය | උප ලේඛන අංකය | පිටු අංකය | 2014 රු. | 2013 රු. |
|---|---|---|---|---|
| වත්කම් | | | | |
| ජංගම නොවන වත්කම් | | | | |
| ස්ථාවර වත්කම් (ලියා හළ අගයට) | 1 | 12 | 2,714,648,111 | 2,757,147,939 |
| ස්ථාවර වත්කම් කෙරීගෙන යන වැඩ | 2 | 14 | 1,293,146,855 | 1,297,678,869 |
| | | | 4,007,794,966 | 4,054,826,808 |
| ජංගම වත්කම් | | | | |
| තොගය | 3 | 14 | 27,660,436 | 28,024,162 |
| ණය ගැතියෝ - විවිධ | 4 | 14 | 481,153 | 5,865,785 |
| බැදුම්කර කඩකිරීම් | | | 1,678,413 | |
| විවිධ අත්තිකාරම් | 5 | 14 | 9,953,774 | 4,912,296 |
| සැපයුම් හා සේවා අත්තිකාරම් | 6 | 15 | 14,061,175 | 12,343,330 |
| ඉදිරියට ගෙවීම් | 7 | 15 | 2,197,842 | 1,729,825 |
| මූල්‍ය වත්කම් | | | | |
| කාර්යය මණ්ඩලය සඳහා ණය හා අත්තිකරම් | 8 | 15 | 30,267,101 | 26,688,129 |
| ආයතන වලින් අයවිය යුතු මුදල් | 9 | 15 | 6,313,900 | 2,338,800 |
| ජංගම අත්තිකාරම් | 2 | 13 | 38,372,097 | 50,307,692 |
| කඩ කරන ලද අරමුදල් ආයෝජනයන් | 10 | 16 | 106,448,907 | 77,883,373 |
| වෙනත් ආයෝජන | 10 | 16 | 90,072 | 80,229 |
| බැංකුවේ මුදල් ශේෂය | 11 | 17 | 45,421,843 | 27,676,583 |
| | | | 282,946,713 | 237,850,204 |
| **මුළු වත්කම්** | | | **4,290,741,679** | **4,292,677,012** |
| අඩු කළා - වගකීම් | | | | |
| ජංගම නොවන වගකීම් | | | | |
| පරිත්‍යාග අරමුදල් | 12 | 19 | 6,389,065 | 2,427,393 |
| පාරිතෝෂික ප්‍රතිපාදන | 13 | 19 | 30,093,460 | 26,475,106 |
| පර්යේෂණ අරමුදල් | 14 | 19 | 6,647,696 | 11,467,078 |
| වෙනත් අරමුදල් | 15 | 19 | 139,079,780 | 102,852,543 |
| | | | **182,210,001** | **143,222,120** |

| | | | | |
|---|---|---|---|---|
| ජංගම වගකීම් | | | | |
| විවිධ ණය හිමියෝ | 17 | 20 | 74,320,313 | 73,933,009 |
| තැන්පතු | 18 | 21 | 71,750,823 | 70,360,467 |
| වියදම් ණය හිමියෝ | 19 | 21 | 27,574,616 | 48,272,145 |
| කල්බදු ණය හිමියෝ | 16 | 20 | | 2,160,000 |
| වෙනත් ගෙවිය යුතු මුදල් | 20 | 21 | 407,466 | 331,496 |
| | | | **174,053,218** | **195,057,117** |
| මුළු වගකීම් | | | **356,263,219** | **338,279,237** |
| | | | | |
| මුළු ශුද්ධ වගකීම් | | | **3,934,478,460** | **3,954,397,775** |
| **ශුද්ධ හිමිකම්** | | | | |
| ප්‍රාග්ධන - වැයවූ මූලධන ප්‍රතිපාදන | | | 1,789,402,116 | 1,829,327,708 |
| ප්‍රාග්ධන - වැයවූ ප්‍රතිපාදන / කෙරීගෙන යන වැඩ | 2 | 13 | 1,293,146,855 | 1,347,986,560 |
| වැයනොවූ මූලධන ප්‍රතිපාදන - ඉඩම් සහ ගොඩනැගිලි මිලදී ගැනීම් | 21 | 23 | 15,609,079 | (67,220,065) |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | | | 830,827,745 | 830,827,745 |
| | | | **3,928,985,795** | **3,940,921,948** |
| විශේෂිත සංචිත | | | | |
| වැය නොවූ මූලධන දීමනා උපකරණ, ගෘහ භාණ්ඩ, පුස්තකාල පොත් සහ වාහන | 21 | 22 | (53,956,963) | (29,055,348) |
| | | | **(53,956,963)** | **(29,055,348)** |
| පුනරුත්තාපන | | | | |
| පුනරුත්තාපන - වැයවූ දීමනා | | | | |
| පුනරුත්තාපන - වැය නොවූ දීමනා | 21 | 22 | 1,283,545 | (15,612,698) |
| පරිත්‍යාග (වත්කම්) | | | | |
| විදේශ ආධාර | 22 | 24 | 153,320,333 | 153,320,333 |
| | | | **154,603,878** | **137,707,635** |
| සංචිත | | | | |
| විශේෂ සංචිත | 23 | 24 | 18,844,910 | 18,623,758 |
| ආයතනයේ පොදු සංචිත | | | (113,999,159) | (113,800,219) |
| | | | **(95,154,249)** | **(95,176,462)** |
| **මුළු ශුද්ධ හිමිකම්** | | | **3,934,478,460** | **3,954,397,774** |

| | | |
|---|---|---|
| ............................................ | ............................................ | ............................................ |
| මහාචාර්ය රංජිත් විජයවර්ධන | ඒ.එම්.ජී.බී.අබේසිංහ | එම්.අයි.එෆ්. රහ්මාන් |
| උපකුලපති | ලේඛකාධිකාරී | මූල්‍යාධිකාරී |

මහාචාර්ය රංජිත් විජයවර්ධන
උපකුලපති
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලේ

ඒ.එම්.ජී.බී.අබේසිංහ
ලේඛකාධිකාරී
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලේ.

එම්.අයි.එෆ්. රහ්මාන්
මූල්‍යාධිකාරී
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලේ

## ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලය
## 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්ව ප්‍රකාශය

| විස්තරය | උප ලේඛන අංකය | පිටු අංකය | 2014 රු. | 2013 රු. |
|---|---|---|---|---|
| මෙහෙයුම් ආදායම | | | | |
| පුනරාවර්ථන ප්‍රතිපාදන | 26 | 25 | 981,305,142 | 836,963,178 |
| ප්‍රාග්ධන ප්‍රතිපාදන ලියාහැරීම් | 27 | 25 | 217,859,998 | 186,046,479 |
| අභ්‍යන්තර ආදායම් -A | 28 | 25 | 18,781,311 | 18,813,813 |
| අභ්‍යන්තර ආදායම් -B (භාහිර පාඨමාලා) | 28 | 25 | 56,736,935 | 36,970,653 |
| මුළු ආදායම | | | 1,274,683,386 | **1,078,794,123** |
| මෙහෙයුම් වියදම | 29 | 26 | | |
| පුද්ගල වැටුප් | | | 575,477,526 | 486,872,409 |
| ගමන් වියදම් | | | 6,541,682 | 4,117,154 |
| සැපයුම් හා පාරිභෝජ්‍ය භාවිතයන් | | | 49,400,058 | 39,933,418 |
| නඩත්තු | | | 30,142,633 | 11,042,883 |
| ගිවිසුම්ගත සේවා | | | 224,417,492 | 227,877,061 |
| පර්යේෂණ හා සංවර්ධන | | | | 7,000,000 |
| වෙනත් මෙහෙයුම් වියදම් - වෙනත්පුනරුත්ථාපන | | | 98,496,029 | 37,602,571 |
| භාහිර පාඨමාලා | | | | 36,970,653 |
| ක්ෂය හා ක්‍රමක්ෂය වියදම් | | | 217,859,998 | 186,055,770 |
| ශිෂ්‍ය ශිෂ්‍යත්ව අරමුදල් | | | 67,702,600 | 59,476,400 |
| මුළු මෙහෙයුම් වියදම | | | 1,270,038,018 | **1,096,948,318** |
| කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/හිඟය | | | **4,645,368** | **(18,154,195)** |

මහාචාර්ය රංජිත් විජයවර්ධන
උපකුලපති

ජේ.එම්.ජේ.බී.අබේසිංහ
ලේඛකාධිකාරී

එම්.අයි.එෆ්. රහ්මාන්
මූල්‍යාධිකාරී

මහාචාර්ය රංජිත් විජයවර්ධන
උපකුලපති
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලේ

ජේ.එම්.ජේ.බී.අබේසිංහ
ලේඛකාධිකාරී
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලේ.



එම්.අයි.එෆ්. රහ්මාන්
මූල්‍යාධිකාරී
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලේ

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ වත්කම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

| විස්තරය | සමුච්චිත අරමුදල 2014 රු. | සමුච්චිත අරමුදල 2013 රු. | ප්‍රත්‍යාගණන සංචිතය | එකතුව 2014 රු. |
|---|---|---|---|---|
| 2013.12.31 දිනට ශේෂය | *(113,800,221)* | *(135,253,795)* | | (135,253,795) |
| ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීම් | | | | |
| පසුව ප්‍රකාශිත ශේෂය | **113,800,221)** | **(135,253,795)** | | **(135,253,795)** |
| දේපළ ප්‍රත්‍යාගණන අතිරික්ත | | | | |
| ආයෝජන ප්‍රත්‍යාගණන හිඟය | | | | |
| පසුගිය වසර සඳහා ප්‍රාග්ධන ක්‍රමක්ෂය ගැළපීම | | | | |
| මූල්‍ය පරිවර්ථන වෙනස්වීම ගැළපීම | | | | |
| මූල්‍ය ක්‍රියාකාරි ප්‍රකාශයේ හඳුනා නොගත් ශුද්ධ ලාභයන් හා පාඩු ගැළපීම | *(4,844,307)* | 39,607,769 | 830,827,745 | 870,435,514 |
| 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය | **118,644,528)** | **(95,646,026)** | **830,827,745** | **735,181,719** |
| දේපළ ප්‍රත්‍යාගණන හිඟය | | | | |
| ආයෝජන ප්‍රත්‍යාගණන අතිරික්ත | | | | |
| මූල්‍ය පරිවර්ථන වෙනස්වීම ගැළපීම | | | | |
| මූල්‍ය ක්‍රියාකාරි ප්‍රකාශයේ හඳුනා නොගත් ශුද්ධ ලාභයන් හා පාඩු ගැළපීම | | | | |
| කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/හිඟය | 4,645,369.00 | (18,154,195) | | (18,154,195) |
| | **13,999,159)** | **(113,800,221)** | **830,827,745** | **717,027,524** |

| | | |
|---|---|---|
| ........................ | ........................ | ........................ |
| මහාචාර්ය රංජිත් විජයවර්ධන | ජී.එම්.ජී.බී.අබේසිංහ | එම්.අයි.එෆ්. රහ්මාන් |
| උපකුලපති | ලේඛකාධිකාරී | මූල්‍යාධිකාරී |

මහාචාර්ය රංජිත් විජයවර්ධන
උපකුලපති
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලේ

ජී.එම්.ජී.බී.අබේසිංහ
ලේඛකාධිකාරී
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලේ.

එම්.අයි.එෆ්. රහ්මාන්
මූල්‍යාධිකාරී
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලේ

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයල මිහින්තලය
2014.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය



(වක්‍ර ක්‍රමය යටතේ)

| විස්තරය | 2014 |
|---|---|
| <u>මෙහෙයුම් ක්‍රියාකරකම් වලින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය</u> | |
| මෙහෙයුම් අතිරික්තය/(හිඟය) | 4,645,368.63 |
| <u>ගැළපීම්</u> | |
| ක්ෂය | 217,859,998.00 |
| පාරිතෝෂික ප්‍රතිපාදන | 4,842,771.77 |
| පොදු සංචිත හා අනෙකුත් ගැළපීම් | (4,623,155.02) |
| මූලධන ප්‍රධානයන් ලියා හැරීම | (217,859,998.00) |
| | 4,864,984.92 |
| <u>කෙරීගෙන යන වැඩ වැඩිවීම/අඩුවීම</u> | |
| තොගය අඩුවීම | 363,726.21 |
| ලැබිය යුතු ආදායම් වැඩිවීම | (9,993,463.80) |
| පෙර ගෙවුම් වැඩිවීම් | (468,017.77) |
| වෙළඳ ණය හිමියෝ අඩුවීම | (20,234,254.29) |
| තැන්පතු වැඩිවීම | 1,390,355.69 |
| **මෙහෙයුම් ක්‍රියාකාරිත්වයෙන් මුදල් ජනනය වීම** | **(24,076,669.04)** |
| පාරිතෝෂික ගෙවීම් | (1,224,417.50) |
| **මෙහෙයුම් ක්‍රියාකාරිත්වයෙන් ශුද්ධ මුදල් ජනනය වීම** | **(25,301,086,.54)** |
| | |
| <u>ආයෝජන ක්‍රියාකරකම් වලින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය</u> | |
| දේපල, පිරියත හා උපකරණ අත්පත්කර ගැනීම් | (216,571,847.00) |
| කෙරීගෙන යන වැඩ සඳහා ගෙවීම් | (175,167,804.00) |
| ස්ථාවර තැන්පතු වල ආයෝජන | (28,565,534.34) |
| ආයෝජන | (3,588,814.56) |
| **ආයෝජන ක්‍රියාකාරිත්වයෙන් ශුද්ධ මුදල් ජනනය වීම** | **(567,251,627.66)** |
| | |
| <u>මූල්‍ය ක්‍රියාකරකම් වලින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය</u> | |
| මූල්‍ය ප්‍රධාන ලැබීම් | 400,200,000.00 |
| පුනරුත්ථාපන ලැබීම් | 30,565,558.00 |
| පර්යේෂණ හා අනෙකුත් අරමුදල් වැඩිවීම | 35,369,527.14 |
| වාහන කල්බදු ගෙවීම් | (2,160,000.00) |
| ඇප බැඳුම්කර කඩවීමෙන් ලද මුදල් | 2,965,261.66) |
| **මූල්‍ය ක්‍රියාකාරිත්වයෙන් ශුද්ධ මුදල් ජනනය වීම** | **466,940,346.80** |
| **ශුද්ධ මුදල් ප්‍රවාහය** | **17,745,259.45** |
| 2013.12.31 දිනට මුදල් | 27,676,583.73 |
| **2014.12.31 දිනට මුදල්** | **45,421,842.86** |

| | | |
|---|---|---|
| ................................ | ................................ | ................................ |
| මහාචාර්ය රංජිත් විජයවර්ධන | ජ්.එම්.ජී.බී.අබේසිංහ | එම්.අයි.එෆ්. රහ්මාන් |
| උපකුලපති | ලේඛකාධිකාරී | මූල්‍යාධිකාරී |
| මහාචාර්ය රංජිත් විජයවර්ධන<br>උපකුලපති<br>ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය<br>මිහින්තලේ | ජ්.එම්.ජී.බී.අබේසිංහ<br>ලේඛකාධිකාරී<br>ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය<br>මිහින්තලේ. | එම්.අයි.එෆ්. රහ්මාන්<br>මූල්‍යාධිකාරී<br>ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය<br>මිහින්තලේ |